# දැක්ම

පුස්තකාල හා තොරතුරු කළමනාකරණ
ක්ෂේත්‍රයේ දැනුම, අධ්‍යාපනය, පර්යේෂණ හා
ව්‍යවසායකත්වය අතර
මනා සම්බන්ධතාවක් ගොඩ නංවමින්
ජාත්‍යන්තර වශයෙන්
කීර්තිමත් විශිෂ්ටත්වයේ
මධ්‍යස්ථානයක් බවට පත් වීම.

## මෙහෙවර

ජාතික සංවර්ධනයේ දී කේන්ද්‍රීය භූමිකාවකට ජීවය දිය හැකි ඉහළ නිපුණතාවක් සහ පරිපූර්ණත්වයක් මෙන්ම අද්විතීය ගුණාත්මකභාවයක් සහිත අත්‍යවශ්‍ය මානව සම්පත් තොරතුරු කළමනාකරණ ක්ෂේත්‍රය තුළ නිපදවීම.

# පටුන


| | |
|---|---|
| දැක්ම | 1 |
| මෙහෙවර | 2 |
| පටුන | 3 |
| අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය | 4 |
| ක්ෂණික යොමුව | 7 |
| කළමනාකරණ මණ්ඩලය | 8 |
| ශාස්ත්‍රීය කමිටුව | 9 |
| කාර්ය මණ්ඩලය | 9 |
| ආයතනයේ පාඨමාලා | 10 |
| උපාධි ප්‍රදානෝත්සවය | 13 |
| බාහිර කථිකාචාර්ය මණ්ඩලය | 14 |
| පර්යේෂණ සම්මන්ත්‍රණ | 15 |
| බාහිර ආයතන සඳහා සම්පත් දායකත්වය | 16 |
| අධ්‍යයන කාර්යමණ්ඩලයේ පර්යේෂණ දායකත්වය | 17 |
| බාහිර ආයතනවල කමිටු සාමාජිකත්වය | 18 |
| පාඨමාලා නිබන්ධ ලැයිස්තු | 23 |
| පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | 30 |
| ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර | 30 |
| මූල්‍ය ප්‍රකාශන | 31 |
| විගණකාධිපති වාර්තාව 2016 | 33 |

## අධ්‍යක්ෂවරයාගේ ප්‍රකාශය



ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (NILIS) 1999 දී කොළඹ විශ්වවිද්‍යාලය යටතේ පිහිටුවන ලද්දේ ලෝක බැංකු ආධාර ලද සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතියෙහි සංරචකයක් ලෙසය. එමගින් මෙරට පාසල් පුස්තකාල 2000 ක් අලුතින් ඉදිකරන ලද අතර තවත් පාසල් පුස්තකාල 2000 ක් ප්‍රතිසංස්කරණය කෙරිණි. NILIS හි ප්‍රධාන කාර්යභාරය වූයේ මෙම පුස්තකාලවලට අලුතින් බඳවා ගන්නා ලද ගුරුපුස්තකාලයාධිපතින් සහ සහායක කාර්යමණ්ඩලය මෙන්ම වෙනත් පුස්තකාලවල කාර්යමණ්ඩල සඳහා අවශ්‍ය ශාස්ත්‍රීය සහ ප්‍රායෝගික පුහුණුව ලබා දීමය. මේ අනුව NILIS ගුරුපුස්තකාලයාධිපතීන් සඳහා ගුරුපුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ශාස්ත්‍රපති සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා ද සහායක කාර්ය මණ්ඩල සඳහා පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා ද ආරම්භ කරන ලදී. මෙයට අමතරව ජාතික ආයතනයක් වශයෙන් NILIS කොළඹ මෙන්ම රටපුරා පළාත් සහ කලාප අධ්‍යාපන කාර්යාල මෙන්ම පාසල් මට්ටමින්ද කෙටි කාලීන පුහුණු පාඨමාලා පවත්වනු ලැබේ. මේ සියලු පාඨමාලා සැලසුම් කර ඇත්තේ පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ ලෝක මට්ටමින් සිදු වෙමින් පවතින සංකල්පීය වෙනස්කම් හා පරිවර්තනයන්ට අනුකූලවන ආකාරයටය. මේ නිසා සහතික පත්‍ර සහ ඩිප්ලෝමා පාඨමාලාවලදී වැඩි වශයෙන් ප්‍රායෝගික කුසලතා වෙත අවධානය යොමු කර ඇති අතර පශ්චාත් උපාධි පාඨමාලාවලදී න්‍යායික කරුණු සාකච්ඡා කෙරේ.

පසුගිය වසර ගණනාව තුළ පාසල් පුස්තකාල සඳහා විශාල වශයෙන් සහායක කාර්යමණ්ඩල බඳවා ගන්නා ලද හෙයින් පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමා (DSL) සහ සහතිකපත්‍ර (CSL) පාඨමාලාවලට විශාල වශයෙන් ඉල්ලුමක් ඇති විය. එහෙයින් මෙම ඉල්ලුම්කරුවන් මුහුණ දුන් මූලික ගැටලුව වූයේ ඔවුන් කොළඹට ඉතා දුරබැහැරව සිටීමය. 2015 දක්වා NILIS පාඨමාලා පවත්වන ලද්දේ කොළඹ පමණක් හෙයින් මෙම සුවිශාල වෙළඳපළ රැක ගැනීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග වෙත යොමු වීමට තීරණය කෙරිණි. මේ අනුව මෙම පාඨමාලා පළාත් මට්ටමින් පැවැත්වීමේ හැකියාව සොයා බලන ලද අතර ඊට වැඩිම ශක්‍යතාව පැවති ඌව පළාත තුළ මෙම පාඨමාලා ඇරඹීමට අවශ්‍ය සාකච්ඡා 2015 දී දියත් කෙරිණි. මේ අනුව 2016 වර්ෂයේ දී NILIS ඉතිහාසයේ පළමු වතාවට පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර පාඨමාලා දෙකක් ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩල පරිශ්‍රයේ ආරම්භ විය. මෙයට ඉතා ඉහළ ප්‍රතිචාරයක් ලැබුණු අතර එම පාඨමාලා මේ වන විට ඌව පළාතේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අතිශය ජනප්‍රියත්වයක් අත් කරගෙන සිටී. මෙම සාර්ථකත්වය නිසා 2017 දී මෙම ප්‍රවණතාව මධ්‍යම සහ සබරගමු

පළාත් සඳහා ව්‍යාප්ත කිරීමට අවශ්‍ය මූලික සාකච්ඡා මෙම වසරේදී පවත්වන ලදී. එමෙන්ම ඌව පළාත තුළ දෙමළ මාධ්‍යයෙන් මෙම පාඨමාලා පැවැත්වීමට ඇති හැකියාව ද සොයා බැලිණි.

ශ්‍රී ලංකාව තුළ පුස්තකාල වර්ග ඉලක්ක කර ගනිමින් විශේෂ පාඨමාලා ප්‍රථම වතාවට හඳුන්වා දෙන ලද්දේ NILIS මගිනි. මහජන පුස්තකාල කාර්යමණ්ඩල ඉලක්ක කර සම්පාදනය කළ මහජන පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමා (DPL) සහ සහතිකපත්‍ර (CPL) පාඨමාලා ඊට උදාහරණ වේ. ඌව සහ සබරගමුව සහ පළාත්වල මෙම පාඨමාලා ප්‍රාදේශීය පැවැත්වීමට අදාළ මූලික සාකච්ඡා මෙම වසරේදී පැවැත්වීය. මේ අනුව 2017 වසර තුළ මෙම පාඨාමාලාවල මහජන පුස්තකාල පාඨමාලා ආරම්භ කිරීමට හැකියාව ලැබෙනු ඇත.

ඉහත සඳහන් පාඨමාලාවලට අමතරව NILIS ආයතනය තොරතුරු කළමනාකරණය, පුස්තකාල හා තොරතුරු විද්‍යා සහ ගුරු පුස්තකාලයාධිපතිත්ව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ ශාස්ත්‍රපති පාඨමාලා පවත්වනු ලබයි.

**අභියෝග**

NILIS ආරම්භයේ සිටම මුහුණ දෙමින් සිටින ප්‍රධානතම අභියෝගය වන්නේ ගුරු පුස්තකාලයාධිපතිත්ව පශ්චාත් උපාධි පාඨමාලා ගුරු පුස්තකාලයාධිපතින්ගේ උසස්වීම් සඳහා අවශ්‍ය සුදුසුකමක් ලෙස ගුරුසේවා ව්‍යවස්ථාවට ඇතුළත් නොකිරීමය. NILIS පසුගිය දශකයට අධික කාලයක් පුරා මේ සඳහා දැඩි උත්සාහයක් දැරුවද උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත මේ සම්බන්ධයෙන් ලිපි ගණනාවක් යවා තිබුණද කිසිඳු පිළිතුරක් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් ලැබී නැත. මෙම හේතුව නිසා පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ඉල්ලුම් කරන සිසුන්ගේ සාපේක්ෂ අඩුවීමක් ඇති වී තිබේ.

**අනාගත සැලසුම්**

ඉහත තත්වය පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන ඒකකයේ නව අධ්‍යක්ෂවරයා සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලද අතර එහිදී මේ සඳහා ගත යුතු ක්‍රියා මාර්ග යෝජනා කෙරිණි. මේ අනුව පාසල් පුස්තකාල විෂයභාර අධ්‍යක්ෂවරු දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් 2017 වසර තුළදී දියත් කිරීමට සැලසුම් කෙරිණි. මේ සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කලාප අනූ අටක (98) ක පුස්තකාල විෂයභාර අධ්‍යක්ෂවරුන් කැඳවීමට නියමිතය. එලෙසම ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව හැදෑරීමට පුස්කකාල විෂය අධ්‍යක්ෂවරු දස දෙනෙකුට අරමුදල් සැපයීමට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යෝජනා කර ඇති අතර එයට සාධනීය ප්‍රතිචාර ලැබී තිබේ.

NILIS පාඨමාලා NVQ සහ SLQF ප්‍රමිතීන්ට අනුව සකස් කිරීමත් විෂයමාලා සංශෝධනය කිරීමත් 2017 වසර තුළ අවසන් කිරීමට සැලසුම් කර ඇත.

NILIS පාඨමාලා හැදෑරූ සහ හැදෑරීමට අපේක්ෂාවෙන් සිටින පාඨමාලාලාභීන් විශේෂයෙන් පාසල් පුස්තකාල ක්ෂේත්‍රය තුළ සිදු කරනු ලබන පරිවර්තනය ප්‍රශංසා කළ යුතු වේ. පාසල් පුස්තකාලයටත් පාසල් පුස්තකාල කාර්යමණ්ඩලයටත් මෙතෙක් නොතිබූ පිළිගැනීමක් අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ලැබීමට ඔවුන්ගේ

දායකත්වය සෘජුව යෙදවී තිබේ. උසස් අධ්‍යාපන ආයතනයක් වශයෙන් මූල්‍යමය ප්‍රතිලාභයට වඩා මෙකී සමාජමය ප්‍රතිලාභ අපි ඉතා ඉහළින් අගය කොට සළකමු. එමෙන්ම පාසල් පුස්තකාල ක්ෂේත්‍රයේ සිදුවන මෙම පරිවර්තනයට ශාස්ත්‍රීය පුරෝගාමීත්වය සැපයීමට ලැබීම ගැන අපි නිහතමානීව සතුටු වන්නෙමු.

ප්‍රසන්න රණවීර
අධ්‍යක්ෂ

**ක්ෂණික යොමුව**


<u>ලියාපදිංචි කාර්යාලය</u>
තැ.පෙ. 1698, කොළඹ 03.
www.nilis.cmb.ac.lk

<u>දුරකථන අංක</u>

| | |
|---|---|
| පොදු | : +94-11-250 7150 |
| අධ්‍යක්ෂ | : +94-11-250 7148 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | : +94-11-3443 793 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි | : +94-11-344 3634 |

ෆැක්ස් අංක : +94-11-2507150

ඊ මේල් : director@nilis.cmb.ac.lk

## කළමනාකරණ මණ්ඩලය

වෛද්‍යා රුවයිස් හනීෆා මයා, සභාපති, SCOLIS/වි.වි. ප්‍ර.කො.ස. නියෝජිත (නිල බලයෙන්)

ප්‍රසන්න රණවීර මයා, අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (නිල බලයෙන්)

මහාචාර්ය ඩබ්. චන්ද්‍රදාස මයා, පීඨාධිපති, අධ්‍යාපන පීඨය (නිල බලයෙන්) - 2016 ජූලි දක්වා

මහාචාර්ය එම්වී.විදානපතිරණ මිය, පීඨාධිපති, අධ්‍යාපන පීඨය (නිල බලයෙන්) - 2016 සැප්තැම්බර් දක්වා

මහාචාර්ය ජී.එන්.වික්‍රමනායක මයා, අධ්‍යක්ෂ, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල වි.වි.ප්‍ර.කො.ස.නියෝජිත

ආචාර්ය වත්මානෙල් සෙනෙවිරත්න මිය, පුස්තකාලයාධිකාරි, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය SCOLIS/වි.වි. ප්‍ර.කො.ස. නියෝජිත

ආචාර්ය පී.විජේතුංග මිය, පුස්තකාලයාධිකාරී, කොළඹ විශ්වවිද්‍යාලය, සභාපති, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (නිල බලයෙන්) 2016 සැප්තැම්බර් සිට

ශිවන්ති වීරසිංහ මිය, සභාපති, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය (නිල බලයෙන්) 2016 ජූලි දක්වා

ආචාර්ය නයනා විජයසුන්දර මිය, පුස්තකාලයාධිකාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, වි.වි.ප්‍ර.කො.ස. නියෝජිත

ඩබ්ලිව්. සුනිල් මයා, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය (නිල බලයෙන්)

එල්.ඒ.ජයතිස්ස මයා, පුස්තකාලයාධිකාරී, කැලණිය විශ්වවිද්‍යාලය SCOLIS/ වි.වි.ප්‍ර.කො.ස. නියෝජිත 2016 සැප්තැම්බර් දක්වා

ගීතා විමලවීර මිය, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශ නියෝජිත

එච්.ඩී.එස්.එන්.හෙට්ටිගේ මයා, සහකාර ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශ නියෝජිත (නිල බලයෙන්)

## ශාස්ත්‍රීය කමිටුව

| | |
|---|---|
| ප්‍රසන්න රණවීර මයා | අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (සභාපති) |
| මහාචාර්ය ඩබ්.චන්ද්‍රදාස මයා | පීඨාධිපති, අධ්‍යාපන පීඨය (2016 ජූනි දක්වා) |
| ඩබ්.පී.සෙනෙවිරත්න මයා | කළමනාකරණ මණ්ඩල නියෝජිත |
| ආචාර්ය වත්මානෙල් සෙනෙවිරත්න මිය | කළමනාකරණ මණ්ඩල නියෝජිත (2016 සැප්තැම්බර් සිට) |
| ආචාර්ය නයනා විජයසුන්දර මිය | කළමනාකරණ මණ්ඩල නියෝජිත (2016 සැප්තැම්බර් සිට) |
| ආර්.කොඩිකාර මිය | SCOLIS නියෝජිත (2016 ඔක්තෝබර් සිට) |
| ආචාර්ය පී.විජේතුංග මිය | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ නියෝජිත (2016 සැප්තැම්බර් සිට) |
| ආචාර්ය රුවන් ගමගේ මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය |
| පී.ජී.ප්‍රේමදාස මයා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය |
| ආචාර්ය සී.මල්ලවාරච්චි මයා | SCOLIS නියෝජිත (2016 ඔක්තෝබර් සිට) |
| ශිවන්ති වීරසිංහ මිය | සභාපති/ ශ්‍රී ලංකා පුස්තකාල සංගමය ((2016 ඔක්තෝබර් සිට) |
| ඩබ්ලිව්. සුනිල් මයා | අධ්‍යක්ෂ ජනරාල්/ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය |
| යූ.පී.අලහකෝන් මයා | සහකාර පුස්තකාලයාධිපති, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය |

## කාර්ය මණ්ඩලය

| සේවක සංඛ්‍යාව | අනුමත සේවක සංඛ්‍යාව | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | සටහන් |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | 01 | 01 | - | - |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | 01 | 01 | - | - |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | 01 | 01 | | |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | 03 | 03 | - | - |
| සහකාර පුස්තකාලයාධිපති | 01 | 01 | - | - |
| පරිගණක යෙදවුම් සහකාර (III ශ්‍රේණිය) | 04 | 04 | - | එක් අයෙකු කොන්ත්‍රාත් පදනම මත සේවය කරයි |
| ලිපිකරු (I ශ්‍රේණිය) | 01 | 01 | - | - |
| පොත් තබන්නා (III ශ්‍රේණිය - B) | 01 | - | 01 | එක් අයෙකු දෛනික පදනම මත සේවය කරයි |
| පුස්තකාල සහකාර (III ශ්‍රේණිය) | 02 | *02 | 02 | * එක් (01) පුස්තකාල සහායකයෙකු පත්කර ඇත. |
| රියදුරු (II ශ්‍රේණිය) | 01 | 01 | - | - |

## ආයතනයේ පාඨමාලා

NILIS ආයතනය දර්ශනපති /ආචාර්ය උපාධි මට්ටමේ සිට සහතිකපත්‍ර මට්ටම දක්වා පාඨමාලා පවත්වනු ලබයි.

**දර්ශනපති/ ආචාර්ය උපාධි (MPhil/PhD) වැඩසටහන්**

NILIS හි පෙර වර්ෂවලදී ලියාපදිංචි වූ සිසුන් අටදෙනෙකු තම අධ්‍යයන කටයුතුවල නිරත වන අතර 2016 වර්ෂයේදී සිසුන් 04 දෙනෙකු අලුතින් ලියාපදිංචි වී ඇත. 2015 වර්ෂයේ ලියාපදිංචි වූ සිසුන්ගේ (පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ විස්තර අංක 01 වගුවේ දැක්වේ.)

**<u>ශාස්ත්‍රපති වැඩසටහන්</u>**

NILIS ආයතනයෙහි පහත සඳහන් ශාස්ත්‍රපති වැඩසටහන් ක්‍රියාත්මක වේ

- තොරතුරු කළමනාකරණ ශාස්ත්‍රපති පාඨමාලාව (MIM)
- පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති පාඨමාලාව (MLS)
- ගුරු පුස්තකාලයාධිපතිත්ව ශාස්ත්‍රපති පාඨමාලාව (MTL)

තොරතුරු කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති (MIM) පාඨමාලාව සඳහා 2015/2017 අධ්‍යයන වර්ෂයේදී ලියාපදිංචි වූ සිසුන්ගෙන් සිසුන් නවදෙනෙකු තම නිබන්ධන කටයුතුවල නිරතවන අතර (පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ විස්තර අංක 02 වගුවේ දැක්වේ) 2016/2018 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 08 දෙනෙක් ලියාපදිංචි වී ඇත.

පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති (MLS) පාඨමාලාව සඳහා 2014/2016 කණ්ඩායමේ සිසුන් 03 දෙනෙක් පාඨමාලාව සම්පූර්ණ කරන ලද අතර අනෙක් සිසුන් තම නිබන්ධනයේ කටයුතු අවසන් කරමින් සිටී. (පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ විස්තර අංක 03 වගුවේ දැක්වේ) පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති (MLS) පාඨමාලාව සඳහා 2015/2017කණ්ඩායම සඳහා සිසුන් 10 දෙනෙක් ලියාපදිංචි වී ඇති අතර ඔවුන් තම පාඨමාලා කටයුතුවල නිරත වේ. (පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ විස්තර අංක 04 වගුවේ දැක්වේ) 2016/2018 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 5 දෙනෙකු ලියාපදිංචි වී ඇත.

**පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා**

NILIS ආයතනයේ පහත සඳහන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවන් පවත්වනු ලබයි.

- පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGLIS)
- තොරතුරු කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGDIM)
- ගුරු පුස්තකාලයාධිපතිත්ව පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (PGTL)

පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ 2015/2017 සඳහා ලියාපදිංචි වූ සිසුන් 15 දෙනෙකු කටයුතුවල නිරතවෙමින් සිටින අතර (පර්යේෂණ මාතෘකා 5 වගුවේ දැක්වේ). 2016/2018 දී ලියාපදිංචි වූ සිසුන් 12 දෙනෙක් ලියාපදිංචි වී ඇත.

තොරතුරු කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව 2015/2017 සිසුන් කණ්ඩායමෙහි සිසුන් 9 දෙනෙකු ඔවුන්ගේ පර්යේෂණ නිබන්ධය සම්පූර්ණ කිරීමේ කාර්යයෙහි නියැලෙති. (පර්යේෂණ මාතෘකා 6 වගුවේ දැක්වේ)

**ඩිප්ලෝමා පාඨමාලා**

NILIS ආයතනය පහත සඳහන් ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලබයි.

- පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (DLIM)
- පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව (DSL)
- මහජන පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව (DPL)

පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව වසර 03 ක පාඨමාලාවක් වන අතර එහි පළමු වර්ෂය පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ප්‍රථම සහතිකපත්‍ර පාඨමාලාව (PILIM) ලෙසද දෙවන වර්ෂය පුස්තකාල හා තොරතුරු කළමනාකරණ අන්තර්මධ්‍ය පාඨමාලාව (ILIM) ලෙසද තෙවන වර්ෂය පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (DLIM) ලෙසද පැවැත්වේ. මේ අනුව පුස්තකාල හා තොරතුරු කළමනාකරණ අන්තර්මධ්‍ය පාඨමාලාව සඳහා 2015/2016 කණ්ඩායමේ සිසුන් 04 දෙනෙකුද , 2015/2016 පළමු කණ්ඩායමේ සිසුන් 12 දෙනෙකුද 2016/2017 දෙවන කණ්ඩායමේ සිසුන් 16 දෙනෙකුද තම අධ්‍යයන කටයුතුවල නිරත වෙමින් සිටී.

පාසල් පුස්තකාලයාධිපතිත්ව ඩිප්ලෝමා (DSL) පාඨමාලාවේ 2015/2016 කණ්ඩායමේ සිසුන් 28 දෙනෙක් සහ 2016/2017 පළමු කණ්ඩායමේ සිසුන් 39 දෙනෙකු තම අධ්‍යයන කටයුතුවල නිරතවන අතර 2016/2017 දෙවන කණ්ඩායම සඳහා සිසුන් 54 දෙනෙකු ලියාපදිංචි විය.

මීට අමතරව ඌව පළාතේ ආරම්භ කරන ලද පාසල් පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (DSL) සඳහා ලියාපදිංචි වූ සිසුන් 77 දෙනෙකු තම අධ්‍යයන කටයුතුවල නිරතවෙමින් සිටී.

මහජන පුස්කතාලයාධිපතිත්ව ඩිප්ලෝමා පාඨමාලාව 2015/2016 කණ්ඩායම සඳහා සිසුන් 14 දෙනෙකු ලියාපදිංචි වූහ. මීට අමතරව 2016/2017 කණ්ඩාටම සඳහා සිසුන් 12 දෙනෙකු ලියාපදිංචි වී ඇත.

## සහතික පත්‍ර පාඨමාලා

NILIS ආයතනය පහත සඳහන් සහතික පත්‍ර පාඨමාලා පවත්වනු ලබයි.

- පාසල් පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CSL)
- මහජන පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CPL)
- ඉංග්‍රීසි සහ තොරතුරු සාක්ෂර කුසලතා සහතික පත්‍ර පාඨමාලාව.

පාසල් පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව සඳහා 2015/2016 අධ්‍යයන වර්ෂයේදී සිසුන් 21 දෙනෙකු තම පාඨමාලාව සම්පූර්ණ කරන ලද අතර 2016 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි වූ සිසුන් 31 දෙනෙකුද තම පාඨලාව අවසන් කරන ලදී. මීට අමතරව 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 53 දෙනෙකු ලියාපදිංචි වී ඇත.

ඌව පළාතේ ආරම්භ කරන ලද පාසල් පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව (CSL) 2016 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 24 දෙනෙකු තම පාඨමාලාව හදාරා නිම කර ඇති අතර 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 51 දෙනෙකු ලියාපදිංචි වී ඇත.

මහජන පුස්තකාලයාධිපතිත්ව සහතික පත්‍ර පාඨමාලාව සඳහා 2016 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 12 දෙනෙකු අධ්‍යයන කටයුතුවල නිරතවන අතර 2016/2017 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 9 දෙනෙකු ලියාපදිංචි වී ඇත.

## කෙටිකාලීන පාඨමාලා

මෙරට පුස්තකාල හා තොරතුරු ක්ෂේත්‍රය තුළ දියුණු මානව සම්පතක් නිර්මාණය කිරීම සඳහා ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය විවිධ කෙටි කාලීන පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. මේ අනුව

2016 පෙබරවාරි 11 වන දා සිට මැයි මස දෙවන දින දක්වා සෑම සතියකම එක් දිනක් පැවැත්වූ බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂවරුන් සහ ගුරුවරුන් සඳහා අන්තර්ජාලය භාවිතයෙන් පන්තිකාමර ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවට පාඨමාලා ලාභීන් 35 දෙනෙකු සහභාගී විය.

2016 පෙබරවාරි 11 වන දා සිට මැයි මස දෙවන දින දක්වා සෑම සතියකම එක් දිනක් පැවැත්වූ බස්නාහිර පළාතේ විදුහල්පතිවරුන් සඳහා පැවැත්වූ අන්තර්ජාලය භාවිතයෙන් පන්තිකාමර ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවට පාඨමාලාලාභීන් 35 දෙනෙකු සහාභාගී විය.

2016 පෙබරවාරි 25 සහ 26, අගොස්තු 31 සහ සැප්තැම්බර් 07, සහ නොවැම්බර් 30 සහ දෙසැම්බර් 05 යන දිනයන්හි තුළ පැවැත්වූ Open Biblio පුස්තකාල කටයුතු ස්වයංක්‍රියකරණය මෘදුකාංගය පිළිබඳ ප්‍රායෝගික වැඩසටහන සඳහා පාඨමාලාලාභීන් 28 දෙනෙකු සහභාගී විය.

2016 අගෝස්තු 18 වන දා සිට සැප්තැම්බර් මස 29 දින දක්වා සෑම සතියකම එක් දිනක් පැවැත්වූ කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ පුහුණු පාඨමාලාව සඳහා පාඨමාලාලාභීන් 8 දෙනෙකු සහභාගී විය.

2016 අගෝස්තු 31 වන දා සිට සැප්තැම්බර් මස 07 යන දිනයන්හි දී පැවැත්වූ Open Biblio පුස්තකාල කටයුතු ස්වයංක්‍රීයකරණය මෘදුකාංගය පිළිබඳ ප්‍රායෝගික වැඩසටහන සඳහා පාඨමාලාලාභීන් 07 දෙනෙකු සහභාගී විය.

2016 නොවැම්බර් මස 16, 17 සහ 18 යන දිනයන්හිදී සහ 2016 නොවැම්බර් මස 24, 25 සහ 28 යන දිනයන්හිදී සහ 2016 නොවැම්බර් 30 දෙසැම්බර් 01 සහ 05 යන දිනයන්හි දී බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා එක්ව බස්නාහිර පලාතේ පාසල් ගුරුවරුන් සහ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සඳහා උපදේශන සහ වෘත්තිය මාර්ගෝපදේශනය පිළිබඳ තුන්දින වැඩමුළුව සඳහා පාඨමාලාලාභීන් 317 දෙනෙකු සහභාගී විය.

2016 නොවැම්බර් මස 21 සහ 22 යන දිනයන්හිදී පැවැත්වූ පුස්තකාල අවකාශ සැලසුම් නව ප්‍රවණතා පිළිබඳ ජාත්‍යාන්තර වැඩමුළුව සඳහා පාඨමාලාලාභීන් 42 දෙනෙකු සහභාගී විය.

2016 නොවැම්බර් මස 30 වන දින පැවැත්වූ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා තොරතුරු සාක්ෂරතාව තේමාව යටතේ 2016 NILIS අධ්‍යයන සම්මන්ත්‍රණය සඳහා පාඨමාලාලාභීන් 57 දෙනෙකු සහභාගී විය.

2016 දෙසැම්බර් මස 6 සිට 9 යන දින දක්වා පැවැත්වූ පූර්ව ළමාවිය සංවර්ධන නිලධාරීන් සඳහා පරිගණක සාක්ෂරතාව හා තොරතුරු හැකියා සංවර්ධනය පිළිබඳ සිව් දින වැඩමුළුව සඳහා පාඨමාලාලාභීන් 35 දෙනෙකු සහභාගී විය.

2016 දෙසැම්බර් මස 12, 14, 15 සහ 16 යන දිනයන්හිදී පැවැත්වූ අධ්‍යාපන ව්‍යාපෘති නිලධාරීන් සඳහා පරිගණක සාක්ෂරතා පුහුණුව සහ ප්‍රජා සවිබල ගැන්වීම පිළිබඳ සිව්දින වැඩමුළුව සඳහා පාඨමාලාලාභීන් 13 දෙනෙකු සහභාගී විය.

## උපාධි ප්‍රදානෝත්සවය

2016 වර්ෂයේ දී පැවති කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවයේදී දර්ශනශූරී උපාධිධාරියෙකුද (01) ශාස්ත්‍රපති උපාධිධාරීන් හතර (04) දෙනෙකු ද පශ්චාත් උපාධි ඩිප්ලෝමා උපාධිධාරීන් දහසය (16) දෙනෙක් ද උපාධි ලබා ගත්හ.

## බාහිර කථිකාචාර්ය මණ්ඩලය

NILIS ආයතනයේ ස්ථිර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සිටිනුයේ තිදෙනෙක් පමණක් බැවින් පාඨමාලාවල දේශන කටයුතු සඳහා වැඩි වශයෙන් බාහිර කථිකාචාර්යවරුන්ගේ සහාය ලබා ගැනේ. ඒ අනුව පහත සඳහන් විද්වතුන් ආයතනයේ පශ්චාත් උපාධි පාඨමාලාවල දේශකයන් වශයෙන් සහභාගී වී ඇත.

මහාචාර්ය පියදාස රණසිංහ, කැලණිය විශ්වවිද්‍යාලය

මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

මහාචාර්ය ගාමිණී ද අල්විස්, කළමනාකරණ හා මූල්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

මහාචාර්ය ඩිල්ජිත් සිං, මලයා විශ්වවිද්‍යාලය, මැලේසියාව

ආචාර්ය වත්මානෙල් සෙනෙවිරත්න, පුස්තකාලයාධිකාරී, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

ආචාර්ය ඩී.කේ.ඩී. ජයකොඩි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වයඹ විශ්වවිද්‍යාලය

ආචාර්ය කේ.ඩී.ජී. විමලරත්න, හිටපු අධ්‍යක්ෂ, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

හැරිසන් පෙරේරා මයා, හිටපු පුස්තකාලයාධිකාරී, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ජී.ආර්. පද්මසිරි මයා, පුස්තකාලයාධිකාරී, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

එල්.ඒ. ජයතිස්ස මයා, පුස්තකාලයාධිකාරී, කැලණිය විශ්වවිද්‍යාලය

එම්.එන්. රවිකුමාර් මයා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, නැගෙනහිර විශ්වවිද්‍යාලය

එල්.එම්. උදය ප්‍රසාද් කබ්රාල් මයා, ලේඛන සංරක්ෂක , ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

ටී. රමනන් මයා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, නැගෙනහිර විශ්වවිද්‍යාලය

හර්ෂ බාලසූරිය මයා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පී.කේ.සී.එම්. විජේවික්‍රම මයා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, සබරගමුව විශ්වවිද්‍යාලය

ජේ.එම්.පී.පී. ජයසිංහ මිය, කථිකාචාර්ය, තොරතුරු තාක්ෂණ පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය

ජී.ජේ.ගුණවර්ධන මිය, ඉංජිනේරු-පාරිභෝගික නිෂ්පාදන අලෙවිකරණය, ශ්‍රී ලංකා ටෙලිකොම්

ඩී.එම්.පී. බණ්ඩාරනායක මිය, පුස්තකාල අධ්‍යක්ෂ, ඇමරිකානු තොරතුරු මධ්‍යස්ථානය

ටී. ප්‍රතීපන් මයා, සහකාර පුස්තකාලයාධිකාරී, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

බුද්ධින් කුමාර මයා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, මොරටුව විශ්වවිද්‍යාලය

මනෝජා සමරදිවාකර මිය, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

චන්දන විජේකෝන් මයා, කථිකාචාර්ය, කළමනාකරණ හා මූල්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

කේ.එම්.ඒ.එස්.ජයසූරිය මයා, අධ්‍යක්ෂ, පුස්තකාල සේවා මණ්ඩලය, බදුල්ල

ඩී.එම්.වයි.යෝමිනී කුමාරි මිය, ගුරු පුස්තකාලයාධිපති, කටුගහ ශ්‍රී ධම්මාලංකාර මහා විද්‍යාලය

එච්.කේ.කරුණාසිරි මයා, පුස්තකාල උපදේශක,පළාත් අධ්‍යාපන කාර්යාලය, බදුල්ල

ඩී.පී.සී. විතාන මිය, සහාකාර පුස්තකාලයාධිපති, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය

එච්.එම්.කේ.හේරත් මැණිකේ මිය, ගුරු පුස්තකාලයාධිපති, මහාමාත්‍ය විද්‍යාලය, බිබිල, මොණරාගල

ජේ.එම්.ගුණසේකර බණ්ඩා මයා, පුස්තකාල සම්බන්ධීකාරක, බිබිල

එම්.ඒ.ඩී එරන්දී දිල්රුක්ෂි ගුරු පුස්තකාලයාධිපති - බ/ශාන්ත ජෝසප් මහා විද්‍යාලය

ඩබ්.පී.ජී.පියසීලි මිය, ගුරු පුස්තකාලයාධිපති, රිදීමාලායද්ද මහා විද්‍යාලය, මහියංගනය

ආර්.එම්.කේ.රත්නායක මිය, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, මොණරාගල අධ්‍යාපන කලාපය, මොණරාගල

## NILIS පර්යේෂණ සම්මන්ත්‍රණ

NILIS පර්යේෂණ සම්මන්ත්‍රණය 2016 නොවැම්බර් 13 දින කොළඹ විශ්වවිද්‍යාලයේදී පවත්වන ලදී. මේ සඳහා සැසිවාර 3 ක් සහ තේමා තුනක් යටතේ පර්යේෂණ පත්‍රිකා 16 ක් ඉදිරිපත් කෙරිණි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා පාසල් පුස්තකාලයේ කාර්යභාරය, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාලිය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සහ කියවීම එකී තේමාවන් විය.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල පාසල් පුස්තකාල සංවර්ධන ඒකකයේ කාර්යභාරය (මධ්‍යම පළාත ඇසුරින්)
**වයි.එම්.මුද්දිකා කුමාරියාපා**
School Library Development Programs based on Staff Training in Teldeniya Educational Zone
**Ayanthi Perera**
සව්බලකරණය 8ආදර්ශය පදනම් කර ගනිමින් අපොස උසස් පෙළ සිසුන්ගේ තොරතුරු කුසලතා සංවර්ධනය හා කාර්ය මූලික පරියේෂණ පිළිබඳ විමසුමක්
**ආර්.එම්.කේ.රත්නායක**
Teaching-learning process through information literacy
**P.M.N.Begam**
ඌව පළාත් පුස්තකාලයාධිපතිත්ව පාඨමාලා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
**එම්.ජේ.සී.හේමලතා**
පාසල් පුස්තකාල ගුණාත්මක ප්‍රවර්ධනය කෙරෙහි ගුරු පුහුණු සැසිවල බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (කෑගල්ල කලාපයේ පාසල් පුස්තකාල ඒකකය සහිත පාසල්වල පුසත්කාල භාර ගුරුභවතුන් ඇසුරෙනි)
**ආර්.ඒ.පී.රත්නායක, ඩබ්.එස්.ඒස්.දයානන්ද**
සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රවේශය සහ නව ප්‍රවණතා
**උදාරා තම්බපණ්ණි දික්කුඹුර**
පරිගණක අධ්‍යාපනය හා පරිගණක ආධාරයෙන් අධ්‍යාපනය (බස්නාහිර පළාතේ අධ්‍යාපන කළාප ඇසුරින්)
**එච්.ටී.කුෂන්ති කුමාර**
සයිබර් අවකාශය තුළ පාසල් සිසුන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා පාසල් පරිගණක ආරක්ෂණ සහ සිද්ධි ප්‍රතිචාර සංසදය
**වාසනා සුරංගි එදිරිසූරිය**
21 වන සියවසේ ඉගෙනුම ඉගැන්වීම් ක්‍රියාවලිය හා තොරතුරු තාක්ෂණයේ බලපෑම
**ආර්.එම්.එම්.ඒ.රත්නායක**
21 වන සියවසේ ඉගෙනුම් කුසලතා සහ නවෝත්පාදක ගුරුවරයා
**කේ.සී.එම්.කුලතිලක**
මධ්‍යම පළාතේ අධ්‍යාපන කලාපවල පිහිටි දුෂ්කර හා අතිදුෂ්කර පාසල්වල දරුවන්ගේ කියවීම ප්‍රවර්ධනය කිරීමේ ප්‍රවේශය
**එච්.එම්.එම්.යූ.බී.හේරත්**
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මක සංවර්ධනය සඳහා ළමා හා යොවුන් සාහිත්‍යය
**චන්ද්‍රිකා අඹේපිටිය**
ප්‍රාථමික ශ්‍රේණිවල ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා තොරතුරු තාක්ෂණය භාවිතය පිළිබඳ අධ්‍යයනයක්
**කේ.ඒ.ඒන්.ඒ. කණහැරාරච්චි**
ළමා සාහිත්‍යකරණයේදී විධිමත් අධ්‍යාපනයක වැදගත්කම
**තනුජා එන්. අයගම**
විසිඑක්වන සියවසේ අධ්‍යාපනයේ අභියෝගය
**කේ.එම්.අසිත සඳරුවන් ජයසූරිය**

## බාහිර අයතන සඳහා සම්පත් දායකත්වය

<u>ආචාර්ය රුවන් ගමගේ මහතා/ ජොෂ්ඨ කථිකාචාර්ය</u>

අධ්‍යාපන නිලධාරී - ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය, Raffles Instiitute ආයතනයේ සම්පත්දායකයෙකු ලෙස කටයුතු කිරීම

ජාතික අධ්‍යාපන ආයතනයේ ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා විෂයමාලා සම්පාදනය

<u>**පී.ජී. පේමදාස මහතා/ ජොෂ්ඨ කථිකාචාර්ය**</u>

මධ්‍යම පළාතේ සංස්කෘතික දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද කියවීම් කඳවුර සඳහා සම්පත් දායකත්වය

නාවුල පුස්සැල්ල විද්‍යාලය, නාවුල

පිල්හත විද්‍යාලය, තෙල්දෙනිය

තලවකැලේ ශ්‍රේට් වෙස්ටර්න් දෙමළ පාසල

කඩව විග්කේෂ්වර් දෙමළ පාසල, හැටන්

නැගෙනහිර සහ අග්නිදිග විශ්වවිද්‍යාලවල ජොෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතීන් සහ පුස්තකාල සහකාරවරුන් සඳහා තොරතුරු සාක්ෂරතා වැඩසටහන්

බස්නාහිර පළාතේ කියවීම් කඳවුර පැවැත්වීම

කොළොන්නාව බාලිකා විද්‍යාලය

ආනන්ද බාලිකා විද්‍යාලය, කොළඹ

ඌව පළාතේ ගුරු උපදේශකයන් සඳහා තොරතුරු සාක්ෂරතා වැඩසටහන්

<u>උදිත අලහකෝන් මහතා/ සහකාර පුස්තකාලයාධිපති</u>

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය සහ අධ්‍යාපන කලාප මගින් මෙහෙයවන වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා සම්පත් දායකත්වය.

## අධ්‍යයන කාර්යමණ්ඩලයේ පර්යේෂණ දායකත්වය

## ප්‍රකාශන

**ආර්.පී.පී.රණවීර මහතා/ අධ්‍යක්ෂ**

ශ්‍රී ලංකාවේ බිබිල දොඩම්ගොල්ල විද්‍යාලයේ ප්‍රජාව තුළ සිසුන්ගේ සාධනය වෙත ගෘහස්ත තොරතුරු කළමනාකරණයේ බලපෑම, 2016 අගෝස්තු ඇමරිකාවේ කොලොම්බස් හි පැවති IFLA සමුළුවට ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකාවේ සියඹලාන්ඩුව අධයාපන කලාපය තුළ සවිබලකරණය 8 තොරතුරු සාක්ෂරතා ආදර්ශය භාවිතයෙන් සිසුන්ගේ තොරතුරු කුසලතා සංවර්ධනය කිරීම, 2016 අගෝස්තු හි ජපානයේ ටෝකියෝ නගරයේ පැවති IASL සමුළුවට ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනය සඳහා තොරතුරු සාක්ෂරතා වැඩසටහන (සාරාංෂය සහිත පෝස්ටර් ඉදිරිපත් කිරීම) 2016 මාර්තු මාසයේ ජර්මනියේ ලිප්සිග් හි පැවති පුස්තකාල සමුළුවට ඉදිරිපත් කරන ලදී.

**ආචාර්ය රුවන් ගමගේ මහතා/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**

පොදු තොරතුරු අවකාශයක් ලෙස පුස්තකාලය ගැන යළි සිතීමක්

**උදිත අලහකෝන් මහතා/ සහකාර පුස්තකාලයාධිපති**

ඇඩම් රොබට්ස් ගේ ෆෙඩ්රික් ජේම්සන් කෘතියේ සිංහල පරිවර්තනය

ඩේලියන් ලීඩර් ගේ ෂාක් ලැකාන් කෘතියේ සිංහල පරිවර්තනය

සීන් හෝමර් ගේ අ ග්‍රැපික් ගයිඩ් කෘතියේ සිංහල පරිවර්තනය

හොං යිං ගේ ආර්ට් ඔෆ් ලව් කෘතියේ පර්වර්තනය (අනුරාගී)

## බාහිර ආයතනවල කමිටු සාමාජිකත්වය

<u>ආර්.පී.පී.රණවීර මහතා /අධ්‍යක්ෂ</u>

- ❖ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යාපන අංශයේ උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.

<u>ආචාර්ය රුවන් ගමගේ මහතා /ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය</u>

- ❖ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ උපදේශන කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.

- ❖ ජාතික විද්‍යා පදනමේ ඩිජිටල්කරණ ව්‍යාපෘතියේ අධීක්ෂණ කමිටු සාමාජිකයෙකු වීම

<u>උදිත අලහකෝන් මහතා / සහකාර පුස්තකාලයාධිපති</u>

- ❖ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ග්‍රන්ථ විඥාපන උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.
- ❖ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ජාතික සාධිකාරී ලේඛන (කර්තෘ, ග්‍රන්ථනාම සහ ආයතන) සම්පාදන කමිටුවල සාමාජිකත්වය දැරීම.
- ❖ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ ප්‍රතිග්‍රහණ ප්‍රතිපත්ති සම්පාදන කමිටුවේ සාමාජිකයෙකු වීම.
- ❖ කොළඹ මහජන පුස්තකාලයේ උපදේශන කමිටුවේ සාමාජිකයෙකු වීම.
- ❖ ජාතික පුස්තකාලයේ මිතුරෝ සංගමයේ ලේකම් ධූරය දැරීම

## 1. පාඨමාලාවන් පිළිබඳ විස්තර

| පාඨමාලාව | සිසුන්ගේ මුළු එකතුව | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මුළු එකතුව | අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මුළු එකතුව |
|---|---|---|---|
| දර්ශනපති/දර්ශනශූරි | 9 | බා.05<br>ස්.02 | 01 |
| පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව- පූර්ණ කාලීන | 22 | බා.11<br>ස්.02 | 01 |
| තොරතුරු කළමනාකරණ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව- අර්ධ කාලීන | 15 | බා.10<br>ස්.01 | |
| තොරතුරු කළමනාකරණ පශ්චාත් උපාධි පාඨමාලාව - පූර්ණ කාලීන | 16 | බා.5<br>ස්.02 | 01 |
| පුස්තකාල හා තොරතුරු විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව අර්ධ කාලීන | 39 | බා.10<br>ස්.01 | 01 |
| පාසල් පුස්තකාලයාධිපතීත්ව ඩිප්ලෝමා පාඨමාලාව | 86 | බා.04<br>ස්. 01 | 01 |
| පාසල් පුස්තකාලයාධිපතීත්ව ඩිප්ලෝමා පාඨමාලාව (ඌව පළාත) | 77 | බා.11<br>ස්. 02 | 01 |
| මහජන පුස්තකාලයාධිපතීත්ව ඩිප්ලෝමා පාඨමාලාව | 26 | බා.08<br>ස්.01 | 01 |
| පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව | - | බා.2<br>ස්. 01 | 01 |
| පුස්තකාල හා තොරතුරු කළමනාකරණ අන්තර්මධ්‍ය පාඨමාලාව | 25 | බා.2<br>ස්. 01 | 01 |
| පුස්තකාල හා තොරතුරු කළමනාකරණ ප්‍රථම සහතික පත්‍ර පාඨමාලාව | 33 | බා. 08<br>ස්.02 | 01 |
| මහජන පුස්තකාලයාධිපතීත්ව සහතික පත්‍ර පාඨමාලාව | 22 | බා.07<br>ස්.01 | 01 |
| පාසල් පුස්තකාලයාධිපතීත්ව සහතික පත්‍ර පාඨමාලාව | 80 | බා.07<br>ස්.02 | |
| පාසල් පුස්තකාලයාධිපතීත්ව සහතික පත්‍ර පාඨමාලාව (ඌව පළාත) | 76 | බා. 11<br>ස්.03 | 01 |
| ඉංග්‍රීසි සහ තොරතුරු සාක්ෂරතා පාඨමාලාව | 27 | බා. 02<br>ස්.01 | |
| අධ්‍යාපනවේදී උපාධිය (3 කොටස)<br>පුස්තකාල හා තොරතුරු කළමනාකරණය (සිංහල මාධ්‍ය) | 63 | ස්.02 | 01 |
| අධ්‍යාපනවේදී උපාධිය (3 කොටස)<br>පුස්තකාල හා තොරතුරු කළමනාකරණය (ඉංග්‍රීසි මාධ්‍ය) | 15 | ස්.02 | 01 |

* ස්. ස්ථිර කථිකාචාර්යවරුන්

* බා. බාහිර කථිකාචාර්යවරුන්

## 2. අධ්‍යයන කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර

- **අධ්‍යක්ෂ - ආර්.පී.පී.රණවීර මහතා (2014.02.23 සිට)**

| විෂය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය |
|---|---|---|
| අධ්‍යාපන විද්‍යාව | ඉංග්‍රීසි/සිංහල | පී.ජී.ප්‍රේමදාස මයා |
| පුස්තකාල විද්‍යාව | ඉංග්‍රීසි/සිංහල | ආර්.පී.පී.රණවීර මයා |
| තොරතුරු තාක්ෂණය | ඉංග්‍රීසි/සිංහල | ආචාර්ය රුවන් ගමගේ මයා |
| සහකාර පුස්තකාලයාධිපති යූ.පී.අලහකෝන් මයා | | |

## 3. පරිපාලන කාර්යමණ්ඩලයේ විස්තර

| අංශය | ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | කණිෂ්ඨ කාර්ය මණ්ඩලය | සුළු සේවකයන් |
|---|---|---|---|
| පරිපාලන | ඒ.අබේරත්න මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී<br>(2016 ජුනි මස වන තෙක්)<br><br>ජේ.පී. විපුලරත්න මයා<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී<br>(2016 ඔක්තෝබර් මස සිට) | ඒ.එන්.එල්. නාමලී මිය,<br>ලිපිකරු II ශ්‍රේණිය<br><br>ටී.එච්.ආර්.බී. චන්ද්‍රතිලක මිය<br>පරිගණක යෙදවුම් සහකාර III ශ්‍රේණිය<br><br>ජේ.කේ.ඩී.එන්. අබේසිංහ මිය<br>පරිගණක යෙදවුම් සහකාර III ශ්‍රේණිය<br>(2016 සැප්තැම්බර් මස සිට)<br><br>ඩබ්.පී. සෙව්වන්දි<br>පරිගණක යෙදවුම් සහකාර III ශ්‍රේණිය<br>(2016 සැප්තැම්බර් මස සිට කොන්ත්‍රාත් පදනම මත) | ඒ.කේ.හද්දාවගේ මයා<br>රියදුරු II ශ්‍රේණිය<br>(කොන්ත්‍රාත් පදනම මත) |
| මූල්‍යාය | එච්.වී.එස්.එම්. ජයසේකර මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | එස්.ඒ.ඩී.ටී.එන්. රත්නායක මයා<br>පොත් තබන්නා II ශ්‍රේණිය<br>(2016 පෙබරවාරි මස වන තෙක්)<br><br>කේ.කේ. රූබසිංහ<br>පරිගණක යෙදවුම් සහකාර III ශ්‍රේණිය<br>(2016 සැප්තැම්බර් මස සිට) | |
| පුස්තකාල | යූ.පී. අලහකෝන් මයා<br>සහකාර පුස්තකාලයාධිපති | බී.පී. වෙත්තසිංහ මිය<br>පුස්තකාල සහකාර III ශ්‍රේණිය<br><br>අයි.ආර්. ශ්‍යාමලී මිය<br>පුස්තකාල සහායක II ශ්‍රේණිය<br>(2016 සැප්තැම්බර් මස සිට) | |

## 4. පර්යේෂණ ප්‍රකාශන පිළිබඳ විස්තර

| විෂය | ප්‍රකාශිත | ප්‍රකාශිත |
|---|---|---|
| (අ) පර්යේෂණ සංඛ්‍යාව | 02 | පර්යේෂණ නිබන්ධන සහ ව්‍යාපෘති වාර්තා 29 |
| (ආ) පොත් සංඛ්‍යාව | 04 | |
| (ඇ) වෙනත් | | |
| එකතුව | 06 | 29 |

## 5.

### I. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

| විෂය | | සම්පූර්ණ කරන ලද | දැනට පවතින |
|---|---|---|---|
| a. පශ්චාත් උපාධි පාඨමාලා ගණන<br>දර්ශනපති/දර්ශනශූරී 02, තොරතුරු කළමනාකරණ 01, පුස්තකාල හා විඥාපන විද්‍යා 02, ගුරුපුස්තකාලයාධිපති (පූර්ණ කාලීන) 01, ගුරුපුස්තකාලයාධිපති (අර්ධ කාලීන) | 08 | 02 | 06 |
| b. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා ගණන | 07 | 03 | 04 |
| c. උපාධි පාඨමාලා ගණන | - | - | - |
| d. ඩිප්ලෝමා පාඨමලා ගණන | 06 | 04 | 02 |
| e. සහතිකපත්‍ර පාඨමාලා ගණන | 11 | 06 | 05 |
| f. වෙනත්<br>වැඩමුළු සහ සම්මන්ත්‍රණ | 25 | 25 | - |
| එකතුව | 57 | 40 | 17 |

## ii. වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

| විෂය | පාඨමාලා ලාභීන් ගණන |
|---|---|
| අන්තර්ජාලය භාවිතයෙන් පන්තිකාමර ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව, බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂවරුන් සහ ගුරුවරුන් සඳහා | 35 |
| අන්තර්ජාලය භාවිතයෙන් පන්තිකාමර ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව, බස්නාහිර පළාතේ විදුහල්පතිවරුන් සඳහා | 35 |
| Open Biblio පුස්තකාල කටයුතු ස්වයංක්‍රීයකරණය මෘදුකාංගය පිළිබඳ ප්‍රායෝගික වැඩසටහන | 28 |
| කාර්යාල කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ පුහුණු පාඨමාලාව | 8 |
| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා එක්ව බස්නාහිර පලාතේ පාසල් ගුරුවුරුන් සහ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සඳහා උපදේශන සහ වෘත්තිය මාර්ගෝපදේශනය පිළිබඳ තුන්දින වැඩමුළුව | 88 |
| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා එක්ව බස්නාහිර පලාතේ පාසල් ගුරුවරුන් සහ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සඳහා උපදේශන සහ වෘත්තිය මාර්ගෝපදේශනය පිළිබඳ තුන්දින වැඩමුළුව | 146 |
| පුස්තකාල අවකාශ සැලසුම් නව ප්‍රවණතා පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව | 42 |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා තොරතුරු සාක්ෂරතාව තේමාව යටතේ 2016 NILIS අධ්‍යයන සම්මන්ත්‍රණය | 57 |
| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා එක්ව බස්නාහිර පලාතේ පාසල් ගුරුවුරුන් සහ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සඳහා උපදේශන සහ වෘත්තිය මාර්ගෝපදේශනය පිළිබඳ තුන්දින වැඩමුළුව | 83 |
| පූර්ව ළමාවිය සංවර්ධය නිලධාරීන් සඳහා පැවැත්වූ සිව් දින පරිගණක සාක්ෂරතාව හා තොරතුරු හැකිය සංවර්ධනය පිළිබඳ වැඩමුළුව | 35 |
| අධ්‍යාපන ව්‍යාපෘති නිලධාරීන් සඳහා පරිගණක සාක්ෂරතා පුහුණුව සහ ප්‍රජා සවිබල ගැන්වීම පිළිබඳ සිව්දින වැඩමුළුව | 13 |

## 1 වගුව - දර්ශනපති ආචාර්ය /උපාධි

| | ශිෂ්‍යාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 1 | ටී.එච්.කේ.ටී සිල්වා මයා | 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනත මගින් ලංකාවේ ප්‍රකාශන අයිතිවාසිකම් ක්ෂේත්‍රයට ඇති වූ බලපෑම | ආචාර්ය තිස්ස හේමරත්න මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>රුහුණු විශ්වවිද්‍යාලය |
| 2 | කේ.එම්.ඒ.එස්. ජයසූරිය මයා | පාසල් විෂය මාලාව සඳහා තොරතුරු සාක්ෂරතා විෂය මාලාවක ව්‍යුහික අවශ්‍යතාවය අධ්‍යයනය කිරීම | ආචාර්ය රුවන් ගමගේ මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 3 | එල්.එම්.යූ. ප්‍රසාද් කබ්රාල් මයා | A Study on the Biology and Ecology of the Invertebrate Fauna Associated with the Documents in Depository Libraries in Sri Lanka with a view of Developing Techniques for Conservation of Documents | Dr. Pascal Querner<br>Institute of Zoology, University of Natural Resources and Life Sciences, Vienna<br><br>මහාචාර්ය එන්.නුගලියද්ද මයා<br>කෘෂි අධ්‍යයන පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය |
| 4 | ඒ.එස්.එම්. අසාහිම් මයා | Quality evaluation of private university libraries in Baharain using libQual model: An empirical study | ආචාර්ය නිෂාඩ් අන්වාස් මයා<br>සහකාර මහාචාර්ය,<br>Assistant Professor College of Business Administration, Kingdom University, Kingdom of Baharain |
| 5 | එන්.එම්. කරන්නාගොඩ මයා | Information Gathering (seeking) Behavior And In-House Library Usage for Academic Purposes of Undergraduates in the Universities of Sri Lanka. | ආචාර්ය වත්මානෙල් සෙනෙවිරත්න මිය,<br>පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |

## 2 වගුව - තොරතුරු කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව (MIM) 2015/2017

| | ශිෂ්‍යාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 01 | එච්.පී.ආර්. ඩබ්. හෙට්ටිආරච්චි මිය | Effect of information literacy skills of health professionals on their academic activities | ආචාර්ය මනෝජා සමරදිවාකර<br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති<br>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 02 | කේ.බී.ජී. සුනේත්‍රා මිය | ජාතික ග්‍රන්ථ විඥාපන පාලනය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය ඇසුරෙන්) | යූ.පී.අලහකෝන් මයා<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 03 | පී.බී.ඩී. රත්නපාල මයා | An Explorative study on the role of Information Visualization in Sales Management | ශාන්ත පුහුල්වැල්ල මයා<br>තොරතුරු තාක්ෂණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>කළමනාකරණ හා වානිජ පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| 04 | එම්.කේ.ජී. යානිකා නන්දසේන මිය | ශ්‍රී ලංකාවේ කම්කරු පරීක්ෂණ ක්‍රියාවලිය සඳහා නව ජාලගත පද්ධතියේ බලපෑම පිළිබඳ සිද්ධි අධ්‍යයනයක් | යූ.පී.අලහකෝන් මයා<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 05 | බී.එස්. උපමාලිකා මිය | උද්‍යාන භෝග වගාවන් පිළිබඳ පර්යේෂණ සඳහා භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණය භාවිතය පිළිබඳ විමර්ෂණාත්මක අධ්‍යයනයක් (පේරාදණිය කෘෂිකර්ම පර්යෙෂණ ආයතනයේ එළවළු වගා පර්යේෂණ නිලධාරීන් ඇසුරින්) | අචාර්ය චම්පා අලහකෝන්<br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| 06 | ෂෙරීන් සාන්තම්පිල්ලේ මිය | Impact of ICT application for Training and Educational services in Training Institute (Irrigation Training Institute) | හර්ෂනී දිසානායක මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති,<br>වෛද්‍ය පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| 07 | එස්.ඒ.ඩී. සමරකෝන් මිය | පාරිභෝගික පැමිණිලි විශ්ලේෂණය කිරීම ගුණාත්මක විදුලි සංදේශ සේවාවට බලපාන අන්දම පිළිබඳ අධ්‍යයනයක් | යූ.පී.අලහකෝන් මයා<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |

## 3 වගුව - පුස්තකාල හා තොරතුරු විද්‍යා ශාස්ත්‍රපති පාඨමාලාව (MLS) 2014/2016

| | ශිෂ්‍යාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 1 | ඒ.සී අබේවර්ධන | Running an efficient library service – main determinants from the users perspective: A case study based on the Postgraduate Institute of Management (PIM) Library | මහාචාර්ය ජේ.ඒ.එස්.කේ.ජයකොඩි මයා,<br>අධ්‍යක්ෂ, මානව සම්පත් අභිවර්ධන ආයතනය,<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 2 | ඩබ්ලිව්.එච්.ඩී.කේ. අබේරත්න මිය | Enhancing self-directed Learning in Higher Education: Case Study at the Faculty of Agriculture, University of Peradeniya, Sri Lanka. | ආචාර්ය ටී.එම්.එස්.එස්.කේ.යටිගම්මන මිය<br>අධ්‍යාපන අධ්‍යනාංශය, ශාස්ත්‍ර පීඨය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| 3 | ඩබ්ලිව්. අයෝනි පෙරේරා මිය | Assessing Information Literacy Competencies of the design undergraduates in “Academy of Design”, Sri Lanka | ප්‍රසන්න රණවීර මයා<br>අධ්‍යක්ෂ<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය |
| 4 | පී.කේ. ජයසේකර මහත්මිය | Influence of Social Media in the choice of a tourist destination; The case of tourists opting to visit Sinharaja Forest, Sri Lanka | ***ප්‍රධාන අධීත්ෂක***<br>මහාචාර්ය ඔස්කා අමරසිංහ මයා<br>කෘෂි අධ්‍යයන පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය<br>***සම අධීක්ෂක***<br>එච්.අයි.ජී.සී.කුමාර මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානව හා සමාජවිද්‍යා අධ්‍යයන පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය |
| 5 | පී.ජී. නිශාන්ත මහතා | “A comparison of citation behavior between traditional and social media’ | ආචාර්ය රුවන් ගමගේ මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |

## 4 වගුව - පුස්තකාල හා තොරතුරු විද්‍යා ශාස්ත්‍රපති පාඨමාලාව (MLS) 2015/2017

| | ශිෂ්‍යාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 01 | ඩී.පී.සී. විතාන මිය | An Explorative Study on use of Mobile Devices in the Home Learning Environment in Early Childhood | අචාර්ය රුවන් ගමගේ<br>ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විදයා ආයතනය |
| 02 | එල්. පන්ඩරම් මිය | Use of Electronic Information Resource: A Case Study of Sri Lanka National Library | එම්.එන්.රවීකුමාර් මයා<br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති<br>නැගෙනහිර විශ්වවිද්‍යාලය |
| 03 | ආර්. නඩේසමූර්ති මිය | Problems and challenges of using social media on Sri Lanka National Library | ජී.ඩී.අරමරසිරි<br>අධ්‍යක්ෂ<br>ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය |
| 04 | වී. අලගරත්නම් මයා | Information needs and information seeking behavior of Military Officer-Students – A special reference to Kotelawala Defense University | ප්‍රසන්න රණවීර මයා<br>අධ්‍යක්ෂ, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය<br>***සම අධීක්ෂක***<br>අචාර්ය ටී.ප්‍රදීපන්<br>සහකාර පුස්තකාලයාධිපති, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය |
| 05 | එස්. වීරසිංහ මිය | Acceptance of Social networks by University librarians in Sri Lanka | ආචාර්ය මේනකා හිඳගොල්ල<br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති,<br>විද්‍යා පීඨ පුස්තකාලය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| 06 | එෆ්. ඉසෙඩ්. ආෂික් මයා | Issues and challenges facing secondary school libraries in selected schools in the Colombo District, Sri Lanka | පුෂ්පමාලා පෙරේරා මිය,ප්‍රධාන පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය, මාලබේ |
| 07 | ආර්.එස්. විතාන මිය | Case Study on the contribution of public library to develop reading skills among children (Based on Dr. Richerd Pathirana Public Library) | යූ.පී.අලහකෝන් මයා<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 08 | පී.කේ. විජේසේකර මිය | Investigating the information literacy skills gaps and academic performance of undergraduates in Faculty of FBESS, that Impact on the final degrees in the KDU | පී.ජී.ප්‍රේමදාස මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |

## 5 වගුව - පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (PGLIS)

| No | ශිෂ්‍යාගේ නම | නිබන්ධනයේ මාතෘකාව | අධීක්ෂකගේ නම |
|---|---|---|---|
| 01 | ජී.එස්.සී. ජයකොඩි මිය | බෝ නොවන රෝගයක් ලෙස හෘදයාබාධයට ගොදුරු වීමෙන් වැළකී සිටීම සඳහා ආහාර රටාව වෙනස් විය යුතු ආකාරය පිළිබඳව කාන්තාවගේ දැනුවත්භාවය පිළිබඳව අධ්‍යයනයක් (ජා ඇල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය ඇසුරින්) | ආචාර්ය රුවන් ගමගේ<br>ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය |
| 02 | ඒ.පී. ඉලංගකෝන් මිය | A Study on impact of selected maths apps, to enhance the mathematical knowledge of the students<br>(Based on Grade - 8 Students in Trinity College) | පී.ජී.ප්‍රේමදාස මයා<br>ජ්‍යොෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 03 | ඩී.ඩබ්.එස්. කරුණාරතන මිය | මහජන පුස්තකාලවල මුද්‍රිත එකතු සංවර්ධනයේ දී අනුගමනය කරන ක්‍රියා පිළිවෙල පිළිබඳ තුලනාත්මක අධ්‍යනයක් ( කොළඹ දිස්ත්‍රික්කයේ මහනගර සභාවලට අයත් මහජන පුස්තකාල ඇසුරිනි) | වරුණි ගහබඩාරච්චි මිය<br>පුස්තකාලයාධිපති,<br>මහජන පුස්තකාලය, කොළඹ |
| 04 | එස්.ආර්.බී.කේ.සී.ඩී. කඩදර මිය | මහපොළ වාරය සහ සාමුද්‍රික විද්‍යා ආයතන පුස්තකාලයෙහි නාවික ඉංජිනේරු හා නාවික ශිල්ප විෂය එකතුව පිළිබඳ ප්‍රමාණාත්මක ඇගයීමක් | යූ.පී.අලහකෝන් මයා<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 05 | එල්.එම්. මාරඹේ මිය | උපකාරක පන්ති සඳහා සහභාගි වන සිසුන්ගේ තොරතුරු ගවේශන චර්යාවන් පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්(මහනුවර සිප්මා අධ්‍යාපන ආයතනයේ 12 ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හදාරන සිසුන් ඇසුරින්) | පී.කේ.එස්. මතුගම මිය<br>ජ්‍යොෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති<br>ප්‍රධාන පුස්තකාලය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 06 | ඩී.එම්.ඩබ්.වී. ජයසිංහ මිය | ප්‍රජා පාදක විශෝධන මධ්‍යස්ථානයන්හි ආශ්‍රිතලාභීන්ගේ විශෝධන කාර්යයේදී තොරතුරු අවශ්‍යතා පිළිබඳ අධ්‍යයනයක් (කොළඹ මහජන පුස්තකාල බල ප්‍රදේශට අයත් කොළඹ කොටුව හා මාලිගාකන්ද විශෝධන මධ්‍යස්ථානය ඇසුරින්) | පී.ජී.ප්‍රේමදාස මයා<br>ජ්‍යොෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 07 | ඩබ්.එච්. අතුකෝරල | ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් වු සිංහල පරිවර්තන සාහිත්‍ය පිළිබඳ ග්‍රන්ථමිතික අධ්‍යයනයක් (2011-2015) | යූ.පී.අලහකෝන් මයා<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |

| | | | |
|---|---|---|---|
| 08 | කේ.ඒ.ඒ.ඩී. සංජීවනී මිය | ශ්‍රී ලංකාවේ සිංහල භාෂාමය ග්‍රන්ථ ප්‍රකාශනයෙහිලා ප්‍රකාශන ආයතනවල දායකත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (2015 ප්‍රකාශිත කෘති ඇසුරින්) | යූ.පී.අලහකෝන් මයා<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 09 | ඩබ්.ඒ. ස්වර්ණකාන්ති මිය | ඉගෙනුම් සාධනය කෙරෙහි කියවීම් කුසලතා බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයක් (වයඹ ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයේ ගුරු සිසුන් ඇසුරින්) | පී.ජී.ප්‍රේමදාස මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 10 | ජී.ජී.ඩබ්.පී. කුරුප්පු මිය | මහජන පුස්තකාලවල සේවාවන්හි ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා මානව සම්පත් සංවර්ධනයේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක් (සබරගමුව පළාතේ මහජන පුස්තකාල ඇසුරින්) | යූ.පී.අලහකෝන් මයා<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 11 | කේ.ජී.ඩබ්.බී. විජේරත්න මයා | නව පුස්තකාල කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීමේදී පාඨකයන් හා කාර්ය මණ්ඩලය මුහුණ පාන ගැටළු පිළිබඳ සිද්ධි අධ්‍යයනයක් (පේරාදෙණිය විශ්වවිද්‍යාල ඇසුරින්) | බී.එම්.එම්.සී.බී.හිඳගොල්ල මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති,<br>කියවීම් අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය |

## 6 වගුව - තොරතුරු කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (PGDIM) 2015/2017

| | Name of the Student | Title of the Dissertation | Supervisor |
|---|---|---|---|
| 01 | බී.කේ.ඒ. මෙන්ඩිස් | Evaluating the multimediality of news articles published by news websites in Sri Lanka | ආචාර්ය රුවන් ගමගේ<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය |
| 02 | ර්.එම්.වයි.සී. මෙන්ඩිස් මිය | "Implementation of an Audio Visual Section in a School Library; a Case study ". | යූ.පී.අලහකෝන් මයා<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 03 | සමන්ත ලියනගේ මයා | Enhance the accuracy of eye injury coding with external cause codes under ICD-10 | අචාර්ය චරිත් ෆොන්සේකා<br>අක්ෂි වෛද්‍ය විශේෂඥ උපදේශක |
| 04 | කේ.ඒ.එන්.ඩී. වීරකෝන් මයා | Evaluation of Online Shopping Websites upon local Customer Preferences and Constraints in Sri Lanka | හර්ෂ බාලසූරිය මයා<br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 05 | එච්.ආර්. තුෂන්ත මයා | Usage of online journals and databases by the postgraduate students at the National Institute of Library & Information Science (NILIS), University of Colombo | යූ.පී.අලහකෝන් මයා<br>සහකාර පුස්තකාලයාධිපති<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 06 | කේ.ඒ.වී. ද සොයිසා මිය | Personal Digital Information Management Among University Academics: A case study The Open University of Sri Lanka. | හර්ෂ බාලසූරිය මයා<br>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති<br>ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය |
| 07 | එම්.එෆ්.එම්. ෂෆ්කාන් මයා | Action Research on Impact of Information Literacy Programs on the use of E-Resources | පී.ජී.ප්‍රේමදාස මයා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය<br>කොළඹ විශ්වවිද්‍යාලය |
| 08 | ආර්.අයි.පී. පීරිස් මිය | Evaluation of digital information resources provided by ITI (Industrial Technology Institute) Library | කමනි පෙරේරා මිය<br>පුස්තකාලයාධිපති<br>Regional Centre for Strategic Studies |
| 09 | ඩබ්.එම්.ඩී.පී. වීරසිංහ මිය | The Evaluation of the Selective Dissemination Information (SDI) service offered by Information Services Centre of Industrial Technology Institute for Research Scientists: User Perceptions | කමනි පෙරේරා මිය<br>පුස්තකාලයාධිපති<br>Regional Centre for Strategic Studies |

## පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| පෞද්ගලික සංවේතන | 19,330,133.00 | 14,821,160.00 |
| ගමන් | 11,001.00 | 2,376.00 |
| සැපයුම් | 706,123.00 | 713,130.00 |
| නඩත්තු | 1,641,561.00 | 1,150,642.00 |
| ගිවිසුම් සේවා | 1,450,676.00 | 1,350,658.00 |
| වෙනත් | 3,437,881.00 | 2,272,443.00 |
| එකතුව | 26,577,375.00 | 20,310,409.00 |

## ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර

| විෂය | 2016<br>රු. | 2015<br>රු. |
|---|---|---|
| 1. ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ පවරා ගැනීම | 1,390,804.00 | 424,821.00 |
| 2. යන්ත්‍ර පවරා ගැනීම | - | 59,217.00 |
| 3. ගොඩනැගිලි ව්‍යූහය පවරා ගැනීම | 762,910.00 | 588,772.21 |
| 4. වෙනත් | 256,748.00 | 113,707.00 |
| එකතුව | 2,410,462.00 | 1,186,517.21 |

# ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය
## 2016-12-31 දිනට ශේෂ පත්‍රය
### සටහන්

| | Notes | 2016 (Rs.) | 2015 (Rs.) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් | 04 | 12,366,248 | 7,270,719 |
| ලැබිය යුතු ආදායම් | 05 | 1,817,672 | 1,449,846 |
| බඩු තොගය | | 159,107 | 163,329 |
| පෙර ගෙවුම් | 06 | 124,243 | 83,010 |
| අනෙකුත් ජංගම වත්කම් | 07 | 6,017,950 | 3,408,762 |
| | | **20,485,220** | **12,375,666** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 3 | 58,256 | 79,756 |
| යන්ත්‍ර හා පිරියත | 3 | 16,146,691 | 4,842,846 |
| ඉඩම් හා ගොඩනැගිලි | | | |
| | | **16,204,947** | **4,922,602** |
| **මුළු වත්කම්** | | **36,690,168** | **17,298,268** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ගෙවිය යුතු වගකීම් | 08 | 1,078,133 | 522,327 |
| කෙටි කාලීන වෙන් කිරීම් | 09 | 4,937,657 | 3,749,337 |
| | | **6,015,790** | **4,271,664** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාමික පාරිතෝෂික | 2 | 2,363,276 | 2,531,151 |
| | | **2,363,276** | **2,531,151** |
| **මුළු වගකීම්** | | **8,379,066** | **6,802,815** |
| **ශුද්ධ වත්කම්** | | **28,311,101** | **10,495,453** |
| **ශුද්ධ වත්කම්/කොටස්** | | | |
| **ප්‍රාග්ධන දායකත්වය** | | | |
| අනෙක් රජයේ ආයතන | 10 | 47,621,544 | 38,095,460 |
| සමුච්චිත අතිරික්තය/ ඌනතාවය | 11 | (19,310,443) | (27,600,007) |
| **මුළු ශුද්ධ වත්කම්** | | **28,311,101** | **10,495,453** |

## ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය
## 2016-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම

| | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **ආදායම්** | | | |
| බදු | | | |
| පාඨමාලා ආදායම් | 12 | 10,834,210 | 4,523,073 |
| පුනරුත්ථාපන හා නඩත්තු ප්‍රතිපාදන | 13 | 762,910 | 588,772 |
| රජයේ ප්‍රතිපාදන | 13 | 17,000,000 | 15,000,000 |
| ශ්‍රම ප්‍රාග්ධන සංවර්ධන ප්‍රතිලාභ | 13 | 1,301,006 | 878,991 |
| වෙනත් ආදායම් | 14 | 2,748,709 | 1,262,039 |
| **මුළු ආදායම** | | **32,646,835** | **22,252,875** |
| **වියදම්** | | | |
| වැටුප් වේතන සහ සේවක ප්‍රතිලාභ | 15 | 19,330,133 | 14,821,160 |
| සැපයුම් හා අනෙකුත් පරිභෝජන | 01 | 706,123 | 713,130 |
| ක්ෂය කිරීම් | 03 | 2,460,088 | 1,802,512 |
| අනෙකුත් වියදම් | 16 | 6,541,119 | 4,776,479 |
| මූල්‍ය පිරිවැය | 01 | 119,910 | 124,744 |
| **මුළු වියදම්** | | **29,157,373** | **22,238,025** |
| **වර්ෂයේ ශුද්ධ අතිරික්තය/ඌනතාවය** | | **3,489,462** | **14,850** |

මගේ අංකය / எனது இல. / My No. } ඊඩියූ/බී/එන්අයිඑල්අයිඑස්/එෆ්ඒ/16
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2017 ජුලි 28 දින

අධ්‍යක්ෂ

ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය. ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන් ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

(i) සමාලෝචිත වර්ෂය තුළදී අත්පත්කරගත් ජංගම නොවන වත්කම්වල වටිනාකම රු.1,647,552 ක් වුවද වර්ෂය තුළ මුදලින් ගෙවූ ප්‍රමාණය රු.1,528,552 ක් විය. කෙසේවුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී අත්පත්කරගත් වත්කම්වල මුළු වටිනාකම මුදල් ගලායාමක් ලෙස සලකා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට ගලපා තිබූ ඉකුත් වර්ෂ ගැලපීම් සහ ආරම්භක ශේෂ සඳහා කරන ලද ගැලපීම රු.1,012,967 ක් මෙහෙයුම් ලාභයට බලපෑමක් සිදුකර නොතිබියදී මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කිරීමේදී මෙහෙයුම් ලාභයට ගලපා තිබුණි. මෙයට අතිරේකව ගෙවියයුතු විශ්‍රාම පාරිතෝෂික ජංගම වගකීම් වැඩිවීම් ලෙස ගලපා තිබියදීත් මෙහෙයුම් ලාභයෙන් අඩුකර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ස්ථාවර වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.18,316,900 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය හා වෙනත් ආයතන විසින් ලබාදුන් ප්‍රදාන වල එකතුව රු.42,812,944 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට එම ප්‍රදානවලින් මිලදීගත් ජංගම නොවන වත්කම්වල ශුද්ධ වටිනාකම රු.16,146,691 ක් විය. එසේ වුවද ප්‍රදානයන් ගිණුම් තැබීම සම්බන්ධයෙන් ආයතනය විසින් ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය තුළදී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම තුළින් ජනිත වූ රු.4,800,000 ක අතිරික්තය ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ වෙනම හෙළිදරව් කළයුතු නමුත් එය සමුච්චිත අරමුදලට එකතු කර දක්වා තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් පන්ති තුනකට අදාල ක්ෂය වෙන්කිරීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද උපලේඛන සමග සැසඳීමේදී රු. 65,424 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලිය | |
| (i) 7(3) වගන්තිය | දර්ශනපති/දර්ශනශූරී පාඨමාලා සම්බන්ධ කටයුතු, උසස් උපාධි කමිටුවක් මගින් සිදුවිය යුතු නමුත් මෙම පාඨමාලාවලට අදාළ කාර්යයන් ශාස්ත්‍රීය කමිටුව හරහා සිදුකර තිබුණි. |

4

| | |
|---|---|
| (ii) 12(1)(ඇ) වගන්තිය | ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයෙකු ලෙස පනත යටතේ නිලබලයෙන් පත් කරනු ලබන විශ්වවිද්‍යාලවල එක් එක් පුස්තකාල හා විඥාපන විද්‍යා අංශයේ ප්‍රධානියා 2016 වර්ෂය තුළදී කිසිදු රැස්වීමකට සහභාගී වී නොතිබුණි. |
| (iii) 12(1)(ඉ) වගන්තිය | ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් වූ ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සංගමයේ නියෝජිතයා 2016 වර්ෂයේ පැවති රැස්වීම් වාර 09 න් 03 කට පමණක් සහභාගී වී තිබුණි. |
| (iv) 12(1)(ඊ) වගන්තිය | ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයන් ලෙස අන්තර් විශ්වවිද්‍යාලයීය පුස්තකාලයාධිපති කමිටුවේ සාමාජිකයන් අතුරින් ඔවුන් විසින් නම්කරනු ලැබූ පුස්තකාලයාධිපතීන් දෙදෙනෙකු පත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවසාන කාර්තුව සඳහා පමණක් පුස්තකාලයාධිපතීන් දෙදෙනෙකු පත්කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.3,489,462 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.14,850 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,474,612 ක වර්ධනයක් ඇති වී තිබුණි. වියදම රු.6,919,348 කින් වැඩිවීමට සාපේක්ෂව ආදායම රු.10,393,960 කින් වැඩිවීම නිසා ඉහත පරිදි මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් ඇති වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල ඇගයීමේදී 2012 වර්ෂයේ රු. 1,796,279 ක් වූ ආයතනයේ ඌනතාවය 2015 හා 2016 වර්ෂවලදී මූල්‍ය අතිරික්තයක් බවට පත්ව තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු. 10,448,949 ක් වූ ආයතනයේ දායකත්වය 2016 වර්ෂයේ රු. 25,327,683 ක් දක්වා වැඩිවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වූ සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතිය 2 (GEP–2) (1994 - 2002) යටතේ පාසල් පුස්තකාල සංවර්ධනය සඳහා බඳවාගත් පුස්තකාලයාධිපතීන් හා එම පාසල්වල ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා අවශ්‍ය මානව සම්පත් පුහුණු කිරීමට කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත කර ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය 1999 අප්‍රේල් 20 දින පිහිටුවන ලදී.

ආයතනය මගින් සමාලෝචිත වර්ෂය තුළදී පාඨමාලා පැවැත්වීම සම්බන්ධ කාර්යසාධනය පහත පරිදි විය.

(අ) ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳව ශාස්ත්‍රපති (MTL) හා ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (PGTL) පාඨමාලා පැවැත්වීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(i) ගුරු පුස්තකාලයාධිපතිවරුන් බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ ශාස්ත්‍රපති (MTL) හා ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (PGTL) යන සුදුසුකම් ඇතුළත් කිරීමට 2009 අගෝස්තු 19 දිනැති අංක 09/1488/316/055 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අධ්‍යාපන අමාත්‍යාංශය ක්‍රියාකල යුතු බව දක්වමින් අනුමැතිය ලබා දී තිබූ නමුත් මෙම සුදුසුකම් ගුරු සේවා ව්‍යවස්ථාවට ඇතුළත් කර නොතිබුණි.

(ii) ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳව පශ්චාත් උපාධි ඩිප්ලෝමා (PGTL) පාඨමාලාවේ 2012, 2013, 2015 හා 2016 යන අධ්‍යයන වර්ෂ සඳහා සිසුන් ලියාපදිංචි වී නොතිබුණු අතර 2010 හා 2014 වර්ෂ සඳහා ලියාපදිංචි වූ මුළු සිසුන් ගණන 20 ක් විය. එයින් සිසුන් 09 දෙනෙකු පාඨමාලාව සාර්ථකව නිමකර තිබූ අතර ඉතිරි 11 දෙනා පාඨමාලාව හැර ගොස් තිබුණි.

(iii) ගුරු පුස්තකාලයාධිපතීත්වය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (MTL) සඳහා 2013, 2015 සහ 2016 වර්ෂ සඳහා සිසුන් ලියාපදිංචි වී නොතිබුණි. 2012 හා 2014 වර්ෂ සඳහා සිසුන් 26 දෙනෙකු ලියාපදිංචි වී තිබූ අතර ඉන් සිසුන් 13 දෙනෙකු පාඨමාලාව සාර්ථකව නිමකර තිබූ අතර 13 දෙනෙකු පාඨමාලාව හැර ගොස් තිබුණි.

(iv) ඉහත (i) පරිදි කටයුතු කර නොතිබීම පාඨමාලා සඳහා ශිෂ්‍ය ඉල්ලුම අඩුවීමට හේතු වී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) 2007 වර්ෂයේ ආරම්භ කරන ලද පුස්තකාල හා තොරතුරු විද්‍යා දර්ශනපති/ දර්ශනශූරී උපාධි පාඨමාලාව සඳහා අඛණ්ඩව සෑම අධ්‍යයන වර්ෂයක් සඳහාම අන්තර්ජාලය, පුවත්පත් හා ගැසට් මගින් තොරතුරු ප්‍රසිද්ධ කර සිසුන් ඇතුළත් කර ගැනීමට කටයුතු කර තිබුණද 2007 – 2010 සිට 2016 – 2019 දක්වා වූ අධ්‍යයන වර්ෂ 10 න් අධ්‍යයන වර්ෂ 6 ක් වෙනුවෙන් පාඨමාලාව සඳහා ශිෂ්‍ය ඉල්ලීම් ලැබී නොතිබුණු අතර අනෙක් අධ්‍යයන වර්ෂ සඳහා සිසුන් 19 ක් බඳවාගෙන තිබුණි.

(i) 2007/2010 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි සිසුන් 07 දෙනාගෙන් එක් සිසුවකු 2017 වර්ෂයේදී දර්ශනපති උපාධියද, තවත් සිසුවකු 2016 වර්ෂයේදී දර්ශණශූරී උපාධියද සාර්ථකව සම්පූර්ණ කරන ලද අතර ඉතිරි සිසුන් පාඨමාලාව හැරගොස් තිබුණි.

(ii) 2011/2014 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ගෙන් නියමිත වර්ෂ 3 ක අධ්‍යයන කාලය ඉක්මවා තිබූ අතර එම සිසුන් පාඨමාලා කාලය දීර්ඝ කරවාගෙන තිබුණි.

(ඇ) පුස්තකාල හා විඥාපන විද්‍යා ශාස්ත්‍රපති (MLS – FT) උපාධි පාඨමාලාව වසර 02 ක පාඨමාලාවක් වූ අතර 2013-2015 හා 2014-2016 අධ්‍යයන වර්ෂ 02 ක සඳහා ලියාපදිංචි සිසුන් ගණන 11 ක්වූ අතර සිසුන් 05 දෙනෙකු පාඨමාලාව නිමකර තිබුණි. කෙසේ වුවද සිසුන් දෙදෙනෙකු පාඨමාලාව හැරගොස් තිබූ අතර සිසුන් 04 දෙනෙකු 2016 දෙසැම්බර් 31 දිනට පාඨමාලාවේ රැඳී සිටින බව නිරීක්ෂණය විය.

(ඉ) මාස 18 ක පාඨමාලාවක් වූ තොරතුරු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (PGDIM) සඳහා 2013-2014 හා 2014-2015 අධ්‍යයන වර්ෂ 02 සඳහා සිසුන් 27 දෙනෙකු ලියාපදිංචි වී සිසුන් 07 දෙනෙකු පමණක් පාඨමාලාව අවසන් කර තිබූ අතර සිසුන් 10 දෙනෙකු පාඨමාලා කාලය දීර්ඝ කර තිබුණි. තවත් සිසුන් 10 දෙනෙකු පාඨමාලාව හැරගොස් තිබුණි. 2015-2016 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 11 දෙනෙකු ලියාපදිංචි වී තිබුණු අතර 2016-2017 අධ්‍යයන වර්ෂය සඳහා කිසිදු සිසුවෙකු ලියාපදිංචි වී නොතිබුණි.

4.2 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රකාරව මිලදී ගැනීම් එම වර්ෂය තුළදීම සිදු නොකිරීම නිසා වැය නොකල රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය, 2016 ජනවාරි 01 දිනට රු.2,362,641 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා රු.4,200,000 ක ප්‍රදාන ලැබී තිබුණු අතර එයින් රු.762,910 ක් හා

රු.1,301,006 ක් පිළිවෙලින් පුනරුත්ථාපන ප්‍රදාන හා මානව ප්‍රාග්ධන සංවර්ධන ප්‍රදාන ගිණුම්වලට මාරුකර තිබුණි. මිලදී ගැනීම් සඳහා වර්ෂය තුළ රු.1,528,552 ක් වැය කර තිබුණු අතර ඒ අනුව 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.2,970,173 ක් විය.

(ආ) 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලියේ 11(2)(ජ) වගන්තිය ප්‍රකාරව ආයතනයේ කටයුතු සඳහා වහාම අවශ්‍ය නොවූ මුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීමට කටයුතු කලයුතු වුවද ඊටපටහැනි ලෙස 2016 දෙසැම්බර් 31 දිනට ආයතනය සතු ජංගම ගිණුම්වල ශේෂය රු.12,366,248 ක් හා සෑම මාසයක් අවසානයේදීම සාමාන්‍ය බැංකු ජංගම ගිණුම් ශේෂය රු.9,664,521 ක් ලෙස පවත්වාගෙන තිබුණි.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | පරිගණක හා උපාංගවල පිරිවැය හඳුනාගතහැකි පරිදි ලේඛන පවත්වා නොගැනීම. |
| (ආ) | මෙහෙයුම් පාලනය | පාඨමාලා සඳහා ශිෂ්‍ය ඉල්ලුම වැඩිකර ගැනීමට කටයුතු නොකිරීම. |

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

# National Institute of

# Library and Information Sciences

NILIS

University of Colombo, Colombo 03, Sri Lanka

මගේ අංකය NILIS/35/2/16

11.09.2017

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක 306/72
පොල්දූව පාර
බත්තරමුල්ල.

මහත්මයාණෙනි,

**<u>කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා මූල්‍ය ප්‍රකාශන පිලිබදව 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 108 (1)වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>**

අප වෙත ලැබී ඇති ඊඩීයූ/බී/එන්අයිඑල්අයිඑස්/එෆ්ඒ/16 දරන විගණන වාර්තාවේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් අප ආයතනයේ අදහස් හා පැහැදිලි කිරීම් පහත පරිදි වේ.

**<u>2. මූල්‍ය ප්‍රකාශන</u>**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.**

(අ) **(i) (ii)** මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙම පෙන්වා දී ඇති අඩුපාඩු ඉදිරි වර්ෂවල මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙළ කිරීමේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ආ) 2017 වර්ෂය තුළදී පූර්ණ වශයෙන් ක්ෂය වූ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරණු ලැබේ.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

2017 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී මේ සම්බන්ධයෙන් සුදුසු ප්‍රතිපත්තියක් හදුන්වා දී අවශ්‍ය ගිණුම තැබීම් කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.3. ගිණුම්කරණ අඩුපාඩු**

2017 වර්ෂයේ ගිණුම් ප්‍රකාශ පිළියෙළ කිරීමේදී නිවැරදි කරනු ලැබේ.

**2.2.4. පැහැදිලි නොකළ වෙනස්කම්.**
2017 වර්ෂයේ ගිණුම් පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරණු ලැබේ.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම.**

**(අ) 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලිය**

**(i) 7(3) වගන්තිය**

නියමාවලියේ 13 (1) හා (2) අනුව ආයතනයේ සියලුම අධ්‍යයන පර්යේෂණ හා විභාග සඳහා අනුමැතිය දීමට බලය පවරා ඇත්තේ ශාස්ත්‍රීය කමිටුව වෙතය. එබැවින් උසස් උපාධි කමිටුව රැස් නොවුන අවස්ථාවලදී ශාස්ත්‍රීය කමිටුවේ නිර්දේශ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට හා සනාතන සභාවේ අනුමැතිය සඳහා යවනු ලැබේ. මේ වන විට උසස් උපාධි කමිටුව පත් කර ඇති අතර 2017 අවශ්‍යතාව මත රැස්වීම් පැවැත්වීමට නියමිතය.

**(ii) 12(1)(ඇ) වගන්තිය**

කැළණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අංශයේ අංශාධිපතිට ශාස්ත්‍රීය කමිටු රැස්වීම් පිළිබඳ දැනුම් දීම් කළ ද රැස්වීම් සඳහා පැමිණියේ නැත. නමුත් 2017 මාර්තු මස සිට අංශාධිපති ස්වාමීන්වහන්සේ රැස්වීම් සඳහා සහභාගී වේ.

**(iii) 12(1)(ඉ) වගන්තිය**

පැවැත්වූ සියලු රැස්වීම් සඳහා ආරාධනා කර ඇතත් නියෝජිතයාගේ කාර්ය බහුලත්වය නිසා සහභාගී වී නැත.

**(iv) 12(1)(ඊ) වගන්තිය**

2016 ජූලි 25 දිනැති ලිපිය මගින් අදාළ සාමාජිකයින් පත්කරන ලෙස අප ඉල්ලා සිටිය ද අන්තර් විශ්වවිද්‍යාලීය පුස්තකාලයාධිපති කමිටුව (SCOLIS) විසින් පත්වීම් සිදුකරන ලද්දේ 2016 සැප්තැම්බර් 27 දින දරන ලිපිය මගිනි.

## 4.00 මෙහෙයුම් සමාලෝචනය

**4.1 කාර්ය සාධනය**

**(අ)**

**(i)** මෙම කාරණය සම්බන්ධයෙන් දිගින් දිගටම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත කරුණු ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධව 2014 වසරේ පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේ දී ද (COPE) සාකච්ඡාවට භාජනය කරන ලදී. එම අවස්ථාවේ පාර්ලිමේන්තු කාරක සභා සභාපතිවරයා පැවසුයේ මෙම ගැටලුවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ඍජු මැදිහත් වීම අවශ්‍ය බව යි. අප ආයතනයේ නියමාවලියට අනුව ශ්‍රී ලංකාවේ සියලුම පුස්තකාල කාර්යමණ්ඩලය සඳහා පාඨමාලා පැවැත්වීමට බලය පවරා ඇත. ඒ අනුව පාසල්, විශ්වවිද්‍යාල, මහජන සහ විශේෂ පුස්තකාලවල කාර්යමණ්ඩල සඳහා පාඨමාලා පවත්වනු ලැබේ. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගුරු පුස්තකාලයාධිපතිවරුන් වෙනුවට 2016 වසරේ සිට පුස්තකාල සහායක කාර්යමණ්ඩලයක් වෙනම පත්කර ඇත. එම කාර්යමණ්ඩල සඳහා අවශ්‍ය පුහුණුව අප ආයතනය මගින් පැවැත්වීමට අමතරව ප්‍රාදේශීය මට්ටමින් ඌව, සබරගමුව සහ මධ්‍යම පළාත් ආවරණය වන පරිදි පාඨමාලා ආරම්භ කර ඇත. පළාත් මට්ටමින් පාඨමාලා ආරම්භ කිරීමෙන් අප ආයතනයේ ශිෂ්‍ය සංඛ්‍යාව 2016 වසරේ දී අපේක්ෂිත සංඛ්‍යාව ද ඉක්මවා ඇත.

පාසල් පද්ධතියට බඳවා ගන්නා ලද ගුරු පුස්තකාලයාධිපතිවරුන් සඳහා හඳුන්වා දෙන ලද ගුරු පුස්තකාලයාධිපති ශාස්ත්‍රපති සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා ඔවුන්ගේ උසස් වීම්වලට අදාළ වන ලෙස ගුරු සේවා ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමට පසුගිය වසර ගණනාවක් පුරා අප උත්සාහ දරා ඇත. මේ සම්බන්ධයෙන් පවතින තත්වය පිළිබඳ විමසා අප ආයතනය අයත් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2016.11.30 සිට 2017.06.14 දක්වා සිහි කැඳවීම් ලිපි 09 ක් යවා ඇති අතර ඊට කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත. අදාල ලිපි පිටපත් අමුණා ඇත. (ඇමුණුම 01 සිට 09 දක්වා)

**(ii)** **විගණකාධිපති වාර්තාවේ** සඳහන් කර ඇති පරිදි අදාල වර්ෂවල ගුරු පුස්තකාලයාධිපතිත්වය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව (PGTL) සඳහා සිසුන් 20ක් නොව සිසුන් 23ක් එනම් 2010/2011 පූර්ණ කාලීන 08ක්, 2010/2012 අර්ධ කාලීන 08ක් සහ 2011/2013 අර්ධ කාලීන 07ක් ලෙස ලියාපදිංචි වී සිට ඇත. එයින් 2010/2011 පූර්ණකාලීන සිසුන් 07දෙනෙකුද 2010/2012 අර්ධ කාලීන සිසුන් තිදෙනෙකුද පාඨමාලාව සාර්ථකව නිම කර ඇත. සිසුන් 07 දෙනෙකු 2011/2013 අධ්‍යයන වසර සඳහා අර්ධ කාලීනව ලියාපදිංචි වී ඇති අතර ඔවුන්

සියලු දෙනාම පාඨමාලාව සාර්ථකව නිම කර ඇත 2014/2015 අධ්‍යයන වසර සඳහා පූර්ණ කාලීන සිසුන් 04 දෙනෙකු ලියාපදිංචි වී ඇති අතර සිසුන් තිදෙනෙකු පාඨමාලාව සාර්ථකව නිම කර ඇත.

PGTL 2010/2011 පූර්ණ කාලීන පාඨමාලාවෙහි ලියාපදිංචි වූ සිසුන් අතුරින් එක් සිසුවෙකු ඔහුට අදාල නියමිත අධ්‍යයන වර්ෂ තුල අදාල විෂයන් සමත් වී නොතිබීමත් ව්‍යාපෘති වාර්තාව භාරදී නොතිබීමත් හේතුවෙන් පාඨමාලාව නිම කිරීමට නොහැකිවූ අතර PGTL 2010/2012 අර්ධ කාලීන පාඨමාලාවෙහි සිසුන් අතුරින් 05 දෙනෙකු අදාල විෂයන් සමත් වූ අතර ඔවුන්ට නියමිත අධ්‍යයන වර්ෂ තුල ව්‍යාපෘති වාර්තාව භාරදීමට නොහැකිවිය. මේ වනවිට ඔවුන්ට පාඨමාලාව නිම කිරීමට නියමිතව තිබූ අධ්‍යයන කාල සීමාව අවසන් වී ඇත. අදාල අධ්‍යයන කාල සීමාව තුලදී සෑම වසරක් පාසාම ඔවුන්ට ව්‍යාපෘති වාර්තා භාර දෙන ලෙසත් පරීක්ෂණ සම්පූර්ණ කරන ලෙසත් ලිඛිත දැනුම්දීම් කර ඇත.

**(iii)** ගුරු පුස්තකාලයාධිපතිත්ව පශ්චාත් උපාධි පාඨමාලාව (MTL) සඳහා සඳහන් කර ඇති වර්ෂවල ලියාපදිංචි වී ඇති සිසුන් සංඛ්‍යාව විය යුත්තේ 26ක් නොව සිසුන් 23කි. එනම් සිසුන් 12 ක් 2012/2013 පූර්ණ කාලීන ලෙස හා සිසුන් 06ක් 2012/2014 අර්ධ කාලීන ලෙසද ලියාපදිංචි වී ඇත. එයින් 2012/2013 පූර්ණකාලීන සිසුන් 09 දෙනෙකුද 2012/2014 අර්ධ කාලීන සිසුන් තිදෙනෙකුද පාඨමාලාව සාර්ථකව නිම කර ඇත. 2014/2015 අධ්‍යයන වසර සඳහා පූර්ණ කාලීන සිසුන් 06 දෙනෙකු ලියාපදිංචි වී ඇති අතර එක් සිසුවකු පාඨමාලාව සාර්ථකව නිම කර ඇත.

MTL 2012/2014 අර්ධ කාලීන පාඨමාලාවෙහි ලියාපදිංචි වී ඇති සිසුන් අතුරින් එක් සිසුවෙකු නියමිත අධ්‍යයන වර්ෂ තුල පාඨමාලාවට අදාල විෂයන් සමත් වී නොතිබීමත් පර්යේෂණ නිබන්ධය භාරදී නොතිබීමත් හේතුවෙන් පාඨමාලාව නිම කිරීමට නොහැකිවිය. අනෙක් සිසුන් දෙදෙනා නියමිත අධ්‍යයන වර්ෂ තුල පාඨමාලාවට අදාල විෂයන් සමත් සමත් වූ නමුත් ඔවුන්ට නියමිත අධ්‍යයන වර්ෂ තුල පර්යේෂණ නිබන්ධය භාරදීමට නොහැකිවිය. අදාල අධ්‍යයන කාල සීමාව තුලදී සෑම වසරක් පාසාම ඔවුන්ට පර්යේෂණ නිබන්ධය භාර දෙන ලෙස ලිඛිත දැනුම්දීම් කර ඇත.

**(iv)** මෙම කාරණය සම්බන්ධයෙන් දිගින් දිගටම අධ්‍යාපන අමාත්‍යාංශය වෙත කරුණු ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධව 2014 වසරේ පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී (COPE) ද සාකච්ඡාවට භාජනය කරන ලදී. එම අවස්ථාවේ පාර්ලිමේන්තු කාරක සභා සභාපතිවරයා පැවසුයේ මෙම ගැටලුවට අධ්‍යාපන අමාත්‍යාංශයේ සෘජු මැදිහත් වීම අවශ්‍ය බව යි.

අප විසින් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ කරන ලද සාකච්ඡාවල ප්‍රතිඵලයක් අධ්‍යාපන අමාත්‍යාංශය 2017 වසරේ දී පුස්තකාල හා තොරතුරු විද්‍යා විෂය අධ්‍යක්ෂවරුන් දස දෙනෙකුට ගුරු පුස්තකාලයාධිපති ශාස්ත්‍රපති පාඨමාලාව හැදැරීමට අරමුදල් සැපයීමට එකඟ වී ඇත. මෙම පාඨමාලාව 2017 සැප්තැම්බර් මස 30 වැනි දින ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත. මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එවන ලද ලිපියේ පිටපතක් අමුණා ඇත. (ඇමුණුම 10) මෙම සිසුන්ට අමතරව තවත් සිසුන් 13 දෙනෙකු පාඨමාලාව හැදැරීමට අයදුම්පත් යොමුකර ඇත.

**(ආ)** සියලුම ඉහළ පර්යේෂණ උපාධි පාඨමාලා (දර්ශනශූරී/දර්ශනපති - MPhil/PhD) අනිවාර්ය ස්වයං අභිප්‍රේරණය මත පදනම් වී ඇති බැවින් සිසුන්ගේ පාඨමාලාව සම්පූර්ණ කිරීම ඔවුන්ගේ උත්සහාය සහ කැපවීම මත රඳා පවතී. MPhil/PhD උපාධි පාඨමාලා සඳහා වසරක් පාසා අයදුම්පත් කැඳවනු නොලැබේ. මේ දක්වා 2007, 2011, 2014 හා 2016 යන වසරවලදී අයදුම්පත් කැඳවා දැන්වීම් පලකර ඇත.

**(i)** 2007 වසරේදී ලියාපදිංචි වූ සිසුන් 07 ගෙන් 05 දෙනෙකුගේ ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට නොතිබූ බැවින් හා ආයතනය විසින් ලබා දෙන ලද MPhil/PhD උපාධි පාඨමාලාවට අදාල උපදෙස් පිලි නොපැදීම යන හේතුන් නිසා ඔවුන්ගේ ශිෂ්‍යභාවය අහෝසි කිරීමට ආයතනය තීරණය කරන ඇත. මෙම සිසුන්ගෙන් එක් සිසුවියක් 2016

දෙසැම්බර් මස පැවති උපාධිප්‍රදානෝත්සවයේ දී දර්ශනශූරි (PhD) උපාධිය ලබා ගන්නා ලදී. තවත් සිසුවියක් උපාධි නිබන්ධය භාර දී ඇති අතර 2017 නොවැම්බර් මස පැවැත්වෙන උපාධිප්‍රදානෝත්සවයේ දී ඇයට දර්ශනපති (MPhil) උපාධිය පිරිනැමීමට නියමිතය.

**(ii)** MPhil/PhD 2011/2014 අධ්‍යයන වර්ෂය සඳහා පාඨමාලාවට සිසුන් තිදෙනෙකු ලියාපදිංචි වී ඇති අතර දෙදෙනෙකුගේ අපේක්ෂිත මට්ටමට නොමැති නිසා ඔවුන්ගේ අධීක්ෂකවරුන්ගෙන් රහස්‍ය වාර්තා කැඳවා ඇත. අධීක්ෂකවරුන්ගෙන් රහස්‍ය වාර්තා ලැබුනු පසු මොවුන් දෙදෙනා සම්බන්ධව තීරණයක් ගැනීමට ශාස්ත්‍රීය කමිටුවට යොමු කෙරෙනු ඇත. අනිත් සිසුවියට කාලය දීර්ඝ කර ගැනීමට දැනුම් දී ඇත.

(ඇ) පුස්තකාල හා විඥාපන විද්‍යා පශ්චාත් උපාධි පාඨමාලාවට(MLS) 2013-2015 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 04 දෙනෙකු ලියාපදිංචි වී ඇති අතර ඔවුන්ගෙන් එක් සිසුවියක් මෙම පාඨමාලාවෙන් ඉවත්වී දර්ශනශූරි (PhD) උපාධිය ලබා ගැනීම සඳහා විදේශගත විය. සිසුන් දෙදෙනෙකුට MLS උපාධිය පිරිනමා ඇත. අනෙක් සිසුවාට අදාල අධ්‍යයන කාල සීමාව තුලදී සෑම වසරක් පාසාම පර්යේෂණ නිබන්ධය භාර දෙන ලෙස ලිඛිත දැනුම්දීම් කර ඇතත් භාරදී නැත. MLS 2014/2016 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 07 දෙනෙකු ලියාපදිංචි වී ඇති අතර සිසුන් තිදෙනෙකුට MLS උපාධිය පිරිනමා ඇත. 2014/2016 අධ්‍යයන වර්ෂයේ තවත් සිසුන් තිදෙනෙකු මේ වනවිට තම පර්යේෂණ නිබන්ධ බාර දී ඇති අතර අනිත් සිසුවාට කාලය දීර්ඝ කර ගැනීමට දැනුම් දී ඇතත් දීර්ඝ කරගෙන නැත.

(ඉ) තොරතුරු කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ (PGDIM) (පූර්ණ කාලීන -Full Time) 2013-2014 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 10ක් හා 2014-2015 අධ්‍යයන වර්ෂය (අර්ධ කාලීන - Part Time) සඳහා සිසුන් 11ක් ලෙස සිසුන් 21ක් ලියාපදිංචි වී ඇත. (විගණකාධිපති වාර්තාවේ සිසුන් 27ක් ලෙස සඳහන්වී ඇත. එය නිවැරදි නොවේ). PGDIM 2013-2014 අධ්‍යයන වර්ෂ (පූර්ණ කාලීන) සිසුන් ගෙන් සිසුන් 04 දෙනෙකුට PGDIM ඩිප්ලෝමාව පිරිනමා ඇති අතර සිසුන් තිදෙනෙකු සියලුම විෂයන් සමත්වී ඇතත් ව්‍යාපෘති වාර්තා බාර දී තිබුණේ නැත. එම තිදෙනාගෙන් එක් සිසුවෙකු මේ වනවිට තම ව්‍යාපෘති වාර්තා බාර දී ඇති අතර අනිත් සිසුන් දෙදෙනාට ව්‍යාපෘති වාර්තා බාර දෙන ලෙස ලිඛිත දැනුම්දීම් කර ඇතත් බාරදී නැත. තවත් සිසුවෙකු මෙවර නැවත පරීක්ෂණයට (repeat examination) පෙනී සිටි අතර ව්‍යාපෘති වාර්තාව බාර දී නැත. PGDIM 2013-2014 අධ්‍යයන වර්ෂ පූර්ණ කාලීන (Full Time) සිසුන් 10න් සිසුන් දෙදෙනෙකු පළමුවර විභාගයට පෙනී සිටියත් සමත්වී නොමැති බැවින් ව්‍යාපෘති වාර්තා බාර දෙන ලෙසට හා නැවත පරීක්ෂණයන්ට පෙනී සිටින ලෙසට ලිඛිත දැනුම්දීම් කර ඇතත් සහභාගී වී නැත.

2014-2015 අර්ධ කාලීන (Part Time) සිසුන්ගෙන් සිසුන් දෙදෙනෙකුට PGDIM ඩිප්ලෝමාව පිරිනමා ඇති අතර සිසුන් 05 දෙනෙකු සියලුම විෂයන් සමත්වී තිබුණ ද ව්‍යාපෘති වාර්තා බාර දී තිබුණේ නැත. එම සිසුන් 05 දෙනාගෙන් තිදෙනෙකු මේ වනවිට තම ව්‍යාපෘති වාර්තා බාර දී ඇති අතර අනිත් සිසුන් දෙදෙනාට ව්‍යාපෘති වාර්තා බාර දෙන ලෙස ලිඛිත දැනුම්දීම් කර ඇතත් බාරදී නැත. 2014-2015 අර්ධ කාලීන (Part Time) සිසුන් 10 දෙනාගෙන් සිසුන් දෙදෙනෙකු පලමු සමාසික පරීක්ෂණයට පෙනී සිටීමෙන් පසු අනෙකුත් පරීක්ෂණයන්ට පෙනී සිටින ලෙසට ලිඛිත දැනුම්දීම් කර ඇතත් සහභාගී වී නැත. 2014-2015 අර්ධ කාලීන (Part Time) සිසුන්ගෙන් එක් සිසුවෙකු ලිඛිත දැනුම්දීම් කළද කිසිදු පරීක්ෂණයකට පෙනී සිට නැත.

2016-2017 අධ්‍යයන වර්ෂයට PGDIM පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවා පුවත් පත් දැන්වීම් පලකළද ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් අයදුම් කර නොතිබූ බැවින් එම පාඨමාලාව ආරම්භ කිරීමට නොහැකි වුණි.

**4.2 අරමුදල් ඌන උපයෝජනය.**

(අ) මෙම මුදල් 2016 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අදාළව වැය කිරීමට වෙන්කර තිබූ මුදල් වන අතර 2016 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ නොවී තිබූ බැවින් 2017 වර්ෂය අවසානය වන විට අදාල ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණවීමත් සමගම මෙම ගිණුමේ ශේෂයක් ඉතිරි නොවනු ඇත.

(ආ) වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ශේෂයද මෙම මුදලට ඇතුලත් වී ඇති අතර 2017 වර්ෂයේදී අදාළ ප්‍රසම්පාදන කටයුතු සම්පූර්ණ වීමත් සමග මෙම ශේෂය එම මුදලින් අඩුවනු ඇත. පාඨමාලා ආදායමෙන් තවදුරටත් අතිරික්තව පවතින මුදල් 2017 වර්ෂයේදී ස්ථාවර වත්කම්වල ආයෝජනය කිරීමට කටයුතු කරනු ලැබේ.

**<u>5. පද්ධති හා පාලනයන්</u>**

දක්වා ඇති පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි වැඩි අවධානයක් යොමුකර දක්වා ඇති අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

(අ) පරිගණක හා උපාංග සඳහා වෙන වෙනම කේතයන් යටතේ ලේබල් කර ඇති අතර 2017 වසරේ ගිණුම් පිළියෙළ කිරීමේදී ඒවායෙහි අගයන් වෙන වෙනම සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) මෙහෙයුම් පාලනය

පාඨමාලා සඳහා ශිෂ්‍ය ඉල්ලුම වැඩිකර ගැනීම සඳහා 2016 වසරේ දි වැඩි අවධානයක් යොමු කළ අතර මේ සඳහා පහත උපාය මාර්ග අනුගමනය කරන ලදි.

1. 2016 වසරේ සිට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පුස්තකාල සඳහා පත්කර ඇත සහායක කාර්යමණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුව අප ආයතනය මගින් පැවැත්වීමට අමතරව දුර බැහැර සිසුන් සඳහා ප්‍රාදේශීය මට්ටමින් ඌව, සබරගමුව සහ මධ්‍යම පළාත් ආවරණය වන පරිදි පාඨමාලා ආරම්භ කර ඇත. පළාත් මට්ටමින් පාඨමාලා ආරම්භ කිරීමෙන් අප ආයතනයේ ශිෂ්‍ය සංඛ්‍යාව 2016 වසරේ දී අපේක්ෂිත සංඛ්‍යාව ද ඉක්මවා ඇති අතර 2017 වසරේ දී ශිෂ්‍ය සංඛ්‍යාව තව දුරටත් වර්ධනය වනු ඇත.
2. දෙමල මාධ්‍ය පාඨමාලා ආරම්භ කිරීම (ඌව පළාත)
3. **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව** සමඟ කරන ලද සාකච්ඡාවක ප්‍රතිඵලයක් ලෙස **විශ්වවිද්‍යාල** පුස්තකාලවල සහයක කාර්යමණ්ඩලය සඳහා පුහුණු පාඨමාලාවන් ආරම්භ කිරීම. (මේ සඳහා **ප්‍රතිපාදන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ලබා දී ඇත)**
4. අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ කරන ලද සාකච්ඡාවලින් පසුව ගුරු පුස්තකාලයාධිපතිත්ව පශ්චාත් උපාධි පාඨමාලාව (MTL) සිසුන් දස දෙනෙකු සඳහා අරමුදල් සැපයීමට එකඟ වී ඇත

ස්තූතියි.

**ප්‍රසන්න රණවීර**
**අධ්‍යක්ෂ**

පිටපත :

**01. ලේකම්/මුදල් අමාත්‍යාංශය**
**02. ලේකම්/උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය**
**03. සභාපතිතුමා/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව**
**04. උපකුලපතිතුමා/කොළඹ විශ්වවිද්‍යාලය**